GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂාව:

## ව්‍යුහාත්මක අභියෝග, ස්ත්‍රීවාදී නවෝත්පාදන සහ රැඩිකල් අනාගතය

වාර්තා සාරාංශය





# ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂාව: ව්‍යුහාත්මක අභියෝග, ස්ත්‍රීවාදී නවෝත්පාදන සහ රැඩිකල් අනාගතය

UKRI GCRF ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂක කේන්ද්‍රය

වාර්තා සාරාංශය

© 2024, The UKRI GCRF ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂක කේන්ද්‍රය. Creative Commons BY-NC 4.0. බලපත්‍රය https://creativecommons.org/licenses/by-nc/4.0/./ යේ ඇත. කේන්ද්‍රයේ සාමාජිකයින් 150 දෙනෙකු මෙම වාර්තාවේ සමකර්තෘවරු වෙති. වැඩි විස්තර සඳහා, www.TheGenderHub.com හි ඇති සම්පූර්ණ වාර්තාව බලන්න.

මෙම බලපත්‍රයේ නියමයන්ට පිටින් වාර්තාවේ අන්තර්ගතය භාවිතා කිරීම පිළිබඳ විමසුම් සහ ඉල්ලීම්වලට පිළිතුරු දීමට කතුවරුන් ඔවුන් වෙනුවෙන් ක්‍රියා කිරීමට මහාචාර්ය කර්ස්ටන් අයින්ලිට සහ මහාචාර්ය ක්‍රිස්ටීන් චින්කින්ට බලය ලබා දේ. කරුණාකර contact@thegenderhub.com හරහා හෝ ඔවුන්ගේ ආයතනික විද්‍යුත් තැපැල් ලිපිනයන් ඔස්සේ ඔවුන් හා සම්බන්ධ වන්න. ඡායාරූප වල ප්‍රකාශන අයිතිය ඡායාරූප ශිල්පීන් සතුව පවතී.

මෙම වාර්තා සාරාංශය එක්සත් රාජධානියේ පර්යේෂණ සහ නවෝත්පාදනය (UKRI) පිළිබඳ ගෝලීය අභියෝගතා පර්යේෂණ අරමුදලේ (GCRF) ප්‍රදාන අංක AH/S004025/1 මගින් අරමුදල් සපයන ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂක කේන්ද්‍රයේ ප්‍රතිදානයකි.

නිර්මාණය: ක්ලෙයාර් හැරිසන් සහ West9 Design. නිදර්ශන: හේෆා  වලබි. මුද්‍රණය: 4-Print Limited.

ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂාව: ව්‍යුහාත්මක අභියෝග, ස්ත්‍රීවාදී නවෝත්පාදන සහ රැඩිකල් අනාගතය

# වාර්තා සාරාංශය: ප්‍රධාන සොයා ගැනීම් සහ නිර්දේශ

අන්තර්ගතය


**ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂක කේන්ද්‍රය** 2

**කේන්ද්‍රයේ වාර්තාව** 3

ව්‍යුහාත්මක අභියෝග 3

කේන්ද්‍රයේ පර්යේෂණ සොයාගැනීම් සහ නිර්දේශ 3

නව ඉදිරි මාර්ග 11

කේන්ද්‍රයේ ආවර්ජන සහ නිර්දේශ 12

රටවලට විශේෂී වූ ක්‍රියා කිරීමට කැඳවීම් 14

# ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂක කේන්ද්‍රය

> **"තවත් ලෝකයක් භව්‍ය නැත, ඇය දැනටමත් ඇගේ ගමනේ ... නිහඬ දවසක මට ඇගේ හුස්ම ඇසේ."**
>
> අරුන්දතී රෝයි, වෝර් ටෝක්, 2003. .

ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්‍ෂක කේන්ද්‍රය ලෝකයේ ඉතා ඉක්මන් විසදිය යුතු අසාධාරණයන් කිහිපයක් ආමන්ත්‍රණය කරයි. ගැටුම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාවන් මත විනාශකාරී, දිගු කාලීන ප්‍රතිවිපාක ඇති කරයි. තවද ජාත්‍යන්තර වශයෙන් සංවර්ධන ඉලක්ක වෙත සාර්ථකව ළඟාවීමට බාධාවන් ඇති කරයි. ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්‍ෂක කේන්ද්‍රය යනු මෙම අභියෝග වලට මුහුණ දීම සඳහා සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ වන පස්වන තිරසාර සංවර්ධන ඉලක්කය, සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන පිළිබඳ වන දහසය වන තිරසාර සංවර්ධන ඉලක්කය සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව (WPS) පිළිබඳ වන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සහ ගෝලීය සිවිල් සමාජ ආයතනයන්, වෘත්තිකයන්, රජයන් සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ වැඩ කරන අන්තර් ජාතික අන්තර් විනය පර්යේෂණ ජාලයකි. 200 කට අධික වන ප්‍රකාශන සහ පර්යේෂණ ප්‍රතිදානයන්ගෙන් සමන්විත වන නව දැනුම සහ ජාල නිර්මාණය කිරීම හරහා, කේන්ද්‍රය කාන්තාවන්ගේ සහ ආන්තික කණ්ඩායම්වල හඬ විස්තාරණය කරන අතර දේශීය හා ගෝලීය ප්‍රතිපත්ති වෙනස් කිරීම සහ ආයතනික ප්‍රතිසංස්කරණ මෙහෙය වීම සිදු කරයි.

කේන්ද්‍රයට ලොව පුරා හවුල්කාර සංවිධාන 40කට අධික සංඛ්‍යාවක්, පර්යේෂණ ව්‍යාපෘති 38ක් සහ සාමාජිකයින් 150ක් ඇතුළත් වේ. එහි නව්‍යතාවය පවතින්නේ එහි අන්තර් විනය අභිලාෂය, එහි ස්ත්‍රීවාදී රාමුව, එය ජනනය කර ඇති සංසන්දනාත්මක විශ්ලේෂණවල පළල සහ ගැටුම් වලදී සහ ඉන් පසුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ තිරසාර යුක්තිය පිළිබඳ සලකා බැලීම් සඳහා වන පරිපූර්ණ ප්‍රවේශයක් පිළිබඳ එහි ඇතුලත් දැක්ම තුළ ය. කේන්ද්‍රය කළමනාකරණය කරනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය පිළිබඳ ලොව ප්‍රමුඛ පෙළේ විද්වතුන්ගෙන් සමන්විත විධායක කණ්ඩායමක් විසින් වන අතර ආර්ථිකය සහ දේශපාන විද්‍යාව සඳහා වන ලන්ඩන් පාසැලේ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව සඳහා වූ මධ්‍යස්ථානයෙන් පරිපාලනය කෙරේ. එහි දිශානතිය සපයනු ලබන්නේ ස්ත්‍රීවාදී පර්යේෂණ ආචාර ධර්ම සමූහයකිනි. මෙම කේන්ද්‍රය එක්සත් රාජධානියේ පර්යේෂණ සහ නවෝත්පාදන ආයතනය (UKRI), ගෝලීය අභියෝගතා පර්යේෂණ අරමුදල (GCRF) හරහා අරමුදල් සපයන අන්තර් විෂය පර්යේෂණ මධ්‍යස්ථාන දොළහෙන් එකකි.

ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂාව: ව්‍යුහාත්මක අභියෝග, ස්ත්‍රීවාදී නවෝත්පාදන සහ රැඩිකල් අනාගතය යනු කේන්ද්‍රයේ තේමා, ව්‍යාපෘති, සහ රටවල් මට්ටමින් සහ කේන්ද්‍රස්ථානයටම අදාළ වන ප්‍රධාන සොයා ගැනීම් සහ නිර්දේශවල සංශ්ලේෂණයකි. කේන්ද්‍රයේ සාමාජිකයින් විසින් සාමූහිකව රචනා කරනු ලද මෙම වාර්තාව කේන්ද්‍රයේ විශ්ලේෂණයන්, ආවර්ජනයන්, සොයාගැනීම් සහ නිර්දේශ, ව්‍යාපෘති, ප්‍රවාහ සහ තනි තනි හඬින් ඉස්මතු කරනු ලබයි. වාර්තාව ව්‍යුහාත්මක අභියෝග, කේන්ද්‍රයේ පර්යේෂණ සහ නව ඉදිරි මාර්ග යන කොටස් වලට බෙදා ඇත. ඒ සෑම කොටසක්ම පහත සාරාංශ කර ඇත. කේන්ද්‍රයේ සහ එහි සාමාජිකයින් පිළිබඳ වැඩි විස්තර www.TheGenderHub.com වෙබ් අඩවියෙන් සොයාගත හැකිය.



# වාර්තා සාරාංශය

## ව්‍යුහාත්මක අභියෝග

එක්සත් ජාතීන්ගේ සංවිධානය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, යුක්තිය සහ ආරක්ෂාව ඉදිරියට ගෙන යාම සඳහා පුළුල් නීතිමය රාමු සකස් කර ඇති අතර රාජ්‍යන් මෙම නීති රාමු මෙන්ම මානව හිමිකම් පිළිබඳ ගිවිසුම් ආයතන සහ මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ ක්‍රියා පටිපාටි මගින් හඳුන්වා දී ඇති අතිරේක වගකීම්ද පිළිගෙන ඇත. ඊට අමතරව, හඳුන්වා දී ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සාමය ඇතුළත් ප්‍රතිපත්තිමය මූලාරම්භයන් (තිරසාර සංවර්ධන අභිමතාර්ථ සහ කාන්තවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ වන න්‍යාය පත්‍රය වැනි) ද පිළිගෙන ඇත. එහෙත් කිසිදු රටක් තිරසාර සංවර්ධන අභිමතාර්ථ සපුරාලීමට අවශ්‍ය නිසි මාර්ගයේ ගමන් කරන්නේ නැති අතර එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සමකාලීන ගැටුම් වලදී තමන්ගේ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව පෙන්වා දී ඇත. මෙම වාර්තාවේ පළමු කොටස කේන්ද්‍රයේ පරේයේෂණ සිදු කරන ලද ගැටුම්වලින් පීඩාවට පත් වූ සන්දර්භයන් තුළ කාන්තාවන්ගේ සහ ආන්තික කණ්ඩායම්වල ජීවිතවල අර්ථවත් වැඩිදියුණු කිරීම් සාක්ෂාත් කර ගැනීම සඳහා ඇති ව්‍යුහාත්මක බාධක විමර්ශනය කරයි. ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂාව සඳහා  වන ප්‍රගතියට බාධා කරමින් මෙම කේන්ද්‍රය වැනි කණ්ඩායම් සිදු කරන පරේයේෂණ සඳහා සතුරු පරිසරයක් නිර්මාණය කරමින් ගැටුම් සහ අර්බුදයන්ගේ ස්ත්‍රී පුරුෂ භූ දර්ශනය හැඩගැස්වීම සඳහා පීතෘමූලිකත්වය, ධනවාදය, යටත්විජිතවාදය සහ මිලිටරිකරණය එක්ව ක්‍රියාත්මක වන ආකාරය විශ්ලේෂණය මගින් සොයා බලයි.

## කේන්ද්‍රයේ පරේයේෂණ සොයාගැනීම් සහ නිර්දේශ

වාර්තාවේ දෙවන කොටස කේන්ද්‍රස්ථානයේ කාර්යය වඩාත් ගැඹුරින් සහ විස්තරාත්මකව ගවේෂණය කරයි. කේන්ද්‍රයේ පර්යේෂණ තේමා හයක් යටතේ ස්වාධීන ව්‍යාපෘති 38ක් හරහා සිදු කරන ලදී. මෙම තේමා වනුයේ පරිවර්තනය සහ බලගැන්වීම, ජීවනෝපාය, ඉඩම් සහ අයිතිවාසිකම්, පුරුෂභාවය සහ ලිංගිකත්වය, සංක්‍රමණය සහ අවතැන් වීම, නීතිය සහ ප්‍රතිපත්ති රාමු සහ ක්‍රමවේද නවෝත්පාදනය යි. මෙම ව්‍යාපෘති ඇෆ්ගනිස්ථානය, කොලොම්බියාව, ඉරාක කුර්දිස්තානය, ලෙබනනය, සියෙරා ලියොන්, ශ්‍රී ලංකාව සහ උගන්ඩාව යන ප්‍රධාන රටවල් හයක මෙන්ම අප්‍රිකාව, දකුණු ඇමරිකාව, යුරෝපය, මැදපෙරදිග සහ ආසියාව පුරා අතිරේක රටවල් දුසිමකට අධික ප්‍රමාණයක ක්‍රියාත්මක විය. තුන්වන පරිච්ඡේදය එක් එක් රටවල් සඳහා විශේෂී වූ අභියෝග, සොයාගැනීම් සහ නිර්දේශ ගෙනහැර දැක්වීමෙන් භූගෝලීය වශයෙන් කේන්ද්‍රයේ කාර්යය ස්ථානගත කරයි. පරිච්ඡේද හතරේ සිට නවය දක්වා එක් එක් පර්යේෂණ ප්‍රවාහය තුළ අධ්‍යනය කරන ලද ප්‍රධාන ප්‍රශ්න ගෙනහැර දක්වන අතර එම සෑම ප්‍රවාහයක් තුළ ඇති ව්‍යාපෘතිවල මාතෘකා, ක්‍රම, සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳ සාරාංශ සපයයි. එක් එක් ප්‍රවාහයෙන් මතුවූ ප්‍රධාන නිර්දේශ පහත දක්වා ඇත.

## ස්ත්‍රී පුරුෂ භාවය, යුක්තිය සහ ආරක්ෂක කේන්ද්‍රස්ථානයේ පර්යේෂණ ව්‍යුහය

| පර්යේෂණ ධාරාව | වාර්තා කොටස | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද රටවල් |
|---|---|---|---|
| **Transformation and Empowerment** | 4.2 | Addressing Post-Colonial Legacies in Transitional Justice | Colombia, Northern Ireland |
| | 4.3 | Culture and Conflict | Afghanistan, India, Pakistan, Sri Lanka |
| | 4.4 | Gender, Governance and Peacebuilding | Jordan, The Philippines, Sri Lanka |
| | 4.5 | Legacies of the Disappeared | Colombia, Sri Lanka |
| | 4.6 | Political Economy of Reconciliation | Colombia |
| | 4.7 | The Potentialities and Politics of Transformation | Sri Lanka |
| | 4.8 | Social and Economic Rights in Transition | Northern Ireland |
| | 4.9 | Women's Political and Economic Empowerment | Colombia |
| | 4.10 | Women's Rights after War | Bosnia-Herzegovina, Colombia, Iraq, Nepal, Sri Lanka, Rwanda |
| **Livelihood, Land and Rights** | 5.2 | Beyond War Compensation | Uganda |
| | 5.3 | Land Policy, Gender and Plural Legal Systems | Sierra Leone |
| | 5.4 | Land Reform, Peace and Informal Institutions | Colombia |
| | 5.5 | When Women Do Not Own Land | Sri Lanka |

| පර්යේෂණ ධාරාව | වාර්තා කොටස | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද රටවල් |
|---|---|---|---|
| **Masculinities and Sexualities** | 6.2 | Changing SOGIE in Conflict, Peace and Displacement in the MENA Region | Lebanon, Turkey, Syria |
| | 6.3 | Cross-Border Wars, Sexuality and Citizenship | Uganda |
| | 6.4 | Men, Peace and Security | Cross-Cutting |
| | 6.5 | Sex, Love and War | Uganda |
| | 6.6 | Sexuality, Work and Gender Relations in Peacekeeping Missions | Bosnia, Democratic Republic of the Congo, Sierra Leone, South Sudan |
| | 6.7 | Transitional Masculinity, Violence and Prevention | Kurdistan-Iraq |
| **Migration and Displacement** | 7.2 | Gender and Forced Displacement | Afghanistan, Kurdistan-Iraq, Pakistan, Sri Lanka, Turkey |
| | 7.3 | Gendered Dynamics of International Labour Migration | Kurdistan-Iraq, Lebanon, Pakistan, Turkey |
| | 7.4 | Return, Reintegration and Political Restructuring | Afghanistan, Kurdistan-Iraq, Pakistan, Sri Lanka |
| **Law and Policy Frameworks** | 8.2 | Donor Funding and WPS Implementation | Colombia, Nepal, Northern Ireland |
| | 8.3 | Feminist Security Politics | Cross-Cutting |
| | 8.4 | Funding Transitional Justice | Cross-Cutting |
| | 8.5 | Gender and Conflict Transformation | Cross-Cutting |
| | 8.6 | Gender and Transitional Justice in Sri Lanka | Sri Lanka |
| **Methodological Innovation** | 9.2 | From Female Combatants to Filmmakers | Colombia, Uganda |
| | 9.3 | The Global Wellbeing and Resilience Index | Cross-Cutting |
| | 9.4 | Innovative Methodologies and Methodological Innovation | Cross-Cutting |
| | 9.5 | Narrating (In)Security | Sri Lanka |
| | 9.6 | Rights Research with Social Media | Cross-Cutting |
| | 9.7 | The Stories of Research | Cross-Cutting |

## පරිවර්තනය සහ බලගැන්වීම



මෙම ප්‍රවාහයේ අරමුණ වන්නේ ගැටුමෙන් පීඩාවට පත් සමාජයන් තුළ ‘පරිවර්තන යුක්තිය’ සහ ‘බලගැන්වීම’ යන සංකල්ප ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ගවේෂණය කිරීම, බලගන්වන්නේ කවුරුන්ද සහ කෙසේද යන්න සොයා බැලීම සහ බල ගැන්වීම අපේක්ෂා කරන්නන් බහු ගැටුම්කාරී සහ පශ්චාත්-ගැටුම් සමාජ වල මුහුණ දෙන ප්‍රායෝගික සහ ආයතනික අභියෝග තේරුම් ගැනීමයි. ප්‍රවාහයේ ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ පහත සඳහන් වේ.

- **කාන්තා අයිතිවාසිකම් ප්‍රමාණවත් නොවීම සහ ආයතනික පරිවර්තනයන් නොමැතිකම:** කාන්තා අයිතිවාසිකම් ආමන්ත්‍රණය කරන නීතිමය සහ දේශපාලන ප්‍රතිසංස්කරණ සහ ආයතනික වෙනස්කම් ගැටුම් සන්දර්භයන් තුළ ප්‍රමාණවත් නොවන අතර සිදු ව ඇති ප්‍රතිසංස්කරණ සහ ආයතනික වෙනස්කම් වලට අන්තර් ඡේදනය විශ්ලේෂණ ඇතුළත් කිරීමට අපොහොසත් වී ඇත.

- **සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යටත්විජිත උරුමයන්:** සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන්ට යටත් විජිත උරුමයන්, සමාජයේ විවිධ පැතිකඩ වල කාන්තා සහ පිරිමින්ගේ නියැලීම කෙරෙහි ඇති කර ඇති දිගුකාලීන ව්‍යුහාත්මක බලපෑම ආමන්ත්‍රණය කල යුතුය.

- **සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට ඇති දේශපාලන අකමැත්ත:** ඓතිහාසික අසාධාරණයන් ආමන්ත්‍රණය කිරීම සහ සංහිඳියාව පෝෂණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වන මෙම යාන්ත්‍රණ බොහෝ විට දේශපාලන බලවේග විසින් නිර්මාණය කරන ලද ධ්‍රැවීකරණය වූ පරිසරය හේතුවෙන් ප්‍රතිරෝධයට මුහුණ දෙයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ පිළියම් ඉටු නොවී පවතින අතර සංක්‍රාන්ති යුක්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට ඇති තීරණාත්මක බාධාවක් ඉස්මතු කර පෙන්වයි.

- **සංහිඳියාවේ සංකීර්ණතා:** පශ්චාත්-ගැටුම් සහිත සමාජවල සංහිඳියාව සංකීර්ණවන අතර බහු ස්ථරයන්ගෙන් සමන්විත වේ. ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ අත්විඳින ලද ගොදුරු වීමේ වර්ගය වැනි සාධක සලකා බැලිය යුතුය. මෙහිදී විවිධ ජනගහණයන්ගේ අපේක්ෂාවන් සහ අවශ්‍යතා ඉටු කිරීම සඳහා සුදුසු පියවර ගැනීම වැදගත් වේ.

- **කාන්තා කටහඬේ කේන්ද්‍රීයත්වය:** පශ්චාත් යුධ පසුබිම්වල පරිවර්තනයන් සහ මැදිහත්වීම්වල කේන්ද්‍රස්ථානයේ කාන්තාවන් සහ ඔවුන්ගේ හඬ ස්ථානගත කළ යුතුය. කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව සහ තිරසාර සංවර්ධ අභිමතාර්ථ වැනි ජාත්‍යන්තර න්‍යායපත්‍ර සමඟ පෙළගැසෙමින් කාන්තා නියෝජිතායතනය සහ යුක්තිය සහ ආරක්ෂාව සඳහා ඔවුන්ගේ සහභාගීත්වයේ වැදගත්කම හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ.

- **ගැටුම් ආරවුල් ආමන්ත්‍රණය කිරීමේදී සංස්කෘතිය භාවිතා කිරීම:** සංස්කෘතික ප්‍රයත්නයන් කාන්තාවන්ට වන්දි ගෙවීමේ, සුව කිරීමේ සහ සවිබල ගැන්වීමේ ප්‍රභවයක් ලෙස භාවිතා කළ හැකි අතර ඔවුන්ගේ ආර්ථික සවිබල ගැන්වීමට සහ කාන්තා ව්‍යාපාර ශක්තිමත් කිරීමට ද දායක කර ගත හැක.

- **COVID-19 වසංගතයේ බලපෑම:** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිලිබඳ පර්යේෂණ වල ප්‍රගතියක් අත් කර ගෙන ඇතත් COVID-19 වසංගතය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමේ ජාතික හා ජාත්‍යන්තර ගමන් පථ පසුගාමී දිශානතියකට යොමු කර ඇති බවක් පෙනෙන්නට තිබේ.

## ජීවනෝපාය, ඉඩම් සහ අයිතිවාසිකම්



මෙම ප්‍රවාහය, විශේෂයෙන් ඉඩම් සහ දේපළ සම්බන්ධයෙන් වන සංක්‍රාන්ති යුක්තිය, ස්ත්‍රී පුරුෂ සමාජීය බල සම්බන්ධතා සහ සමාජ-ආර්ථික අයිතිවාසිකම් අතර අන්තර් ක්‍රියාකාරිත්වය කෙරෙහි අවධානය යොමු කරයි. බොහෝ විට පශ්චාත් ගැටුම් පරිසරයන්හි කාන්තාවන් ගෘහ මූලිකයන් බවට පත්වන නමුත්, පෙර පැවති වෙනස්කම් කිරීම් සහ බැහැර කිරීම් හේතුවෙන් දේපල හිමිකම සහ ඉඩම් ප්‍රවේශය සම්බන්ධයෙන් ඔවුනට අභියෝග වලට මුහුණ දීමට සිදු වන අතර මෙම ප්‍රවාහයේ පර්යේෂණය මේ සම්බන්ධයෙන් කාන්තාවන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් විමර්ශනය සිදු කරයි. ප්‍රවාහයේ ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ පහත සඳහන් වේ.

- **නෛතික බහුත්වවාදය සහ ක්‍රියාත්මක කිරීමේ හිඩැස්:** චාරිත්‍රානුකූල සහ සාමාන්‍ය නීතිවල සහජීවනය කාන්තාවන්ට අසමාන ලෙස බලපාන ක්‍රියාත්මක කිරීමේ හිඩැස් ඇති කරයි. කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම සහතික කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ, සංස්කෘතික පරිවර්තනයන් සහ දැනුවත්භාවය වැඩි කිරීම අවශ්‍ය වේ.

- **සාම්ප්‍රදායික සහ අවිධිමත් ආයතනවල කාර්යභාරය:** විශේෂයෙන් පශ්චාත් ගැටුම් පසුබිම්වලදී, ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමාජ ඒකාබද්ධතාවය වැඩි දියුණු කරමින් ඉඩම් ආරවුල් සමථයකට පත් කිරීමට සහ කාන්තා අයිතිවාසිකම්වලට සහාය වීමට සම්ප්‍රදායික සහ අවිධිමත් ආයතනවලට සැලකිය යුතු හැකියාවක් ඇත.

- **සංක්‍රාන්ති යුක්තිය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉඩම් ප්‍රතිස්ථාපනයේදී ඇති අභියෝග:** ඉඩම් ප්‍රතිසාධනයේදී සංක්‍රාන්ති යුක්ති පියවර ක්‍රියාත්මක කිරීම සංකීර්ණ වේ. ශක්තිමත් ආයතනික රාමු සහ වඩාත් විනිවිද පෙනෙන ක්‍රියාවලීන් නීතිය සහ භාවිතය අතර පරතරය පියවීමට උපකාරී වනු ඇත.

- **ආර්ථික සවිබල ගැන්වීම සහ සමාජ යහපැවැත්ම:** කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම සහ සමස්ත යහපැවැත්ම සඳහා ඉඩම් හිමිකම ඉතා වැදගත් වේ. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉදිරියට ගෙන යාම සඳහා ඉඩම් ප්‍රවේශයට සහ හිමිකාරිත්වයට ඇති බාධක ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වේ.

- **පීතෘමූලික ව්‍යුහයන් සහ සංස්කෘතික සම්මතයන්:** පීතෘමූලික ව්‍යුහයන් සහ සංස්කෘතික සම්මතයන් කාන්තාවන්ගේ ඉඩම් අයිතිවාසිකම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. මෙම සම්මතයන් පරිවර්තනය කිරීමට සහ ඉඩම් පාලනයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනයට දරන ප්‍රයත්න ඉතා වැදගත් වේ.

- **ප්‍රතිපත්ති සහ පාලන ප්‍රතිසංස්කරණ:** ඉඩම් ප්‍රවේශය සාධාරණව සිදු වන බව සහතික කිරීම සඳහා, තීරණ ගැනීමේ ක්‍රියාවලීන් වලට කාන්තාවන් සම්බන්ධ කර ගැනීමේ ප්‍රතිපත්ති සහ පාලන ප්‍රතිසංස්කරණ සහ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

- **දැනුවත් කිරීම සහ උපදේශනය:** ප්‍රජා සහභාගීත්වය සහ විවිධ ක්‍රියාකාරීන් සමඟ සිදු කරන සංවාද මඟින් කාන්තාවන්ගේ ඉඩම් අයිතිය පිළිබඳ දැනුවත් කිරීම සහ පෙනී සිටීම අත්‍යවශ්‍ය වේ. ඉඩම් ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයන්හි නියුතු කාන්තාවන් සඳහා නීති ආධාර සහ සහාය සැපයීම මෙයට අනුපූරක විය යුතුය.

## පුරුෂත්වය සහ ලිංගිකත්වය



පුරුෂාධිපත්‍යය සහ ලිංගිකත්වය පිළිබඳ ප්‍රවාහය, පුරුෂත්වය, ලිංගිකත්වය සහ ප්‍රචණ්ඩත්වය ගොඩනැගීම් පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණයන් විමර්ශනය කරන අතර ඒවා පරිණාමය වන ආකාරය සහ ඒ සම්බන්ධයෙන් ගැටුම් සහ ප්‍රාදේශීය බලපෑම් කෙසේ වේ දැයි ගවේෂණය කරයි. ප්‍රවාහයේ ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ පහත සඳහන් වේ.

- **සංවාද සහ නාභිගත කණ්ඩායම් සාකච්ඡා හරහා ආවර්ජනය කිරීම:** ප්‍රචණ්ඩත්වය, පුරුෂත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධ ගැටළු පිළිබඳ ප්‍රජා අවර්ජනය, විවේචනාත්මක චින්තනය සහ ඇගයීම ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා සංවාද සහ නාභිගත කණ්ඩායම් සාකච්ඡා  පෝෂණය කිරීම අත්‍යවශ්‍ය වේ.

- **ප්‍රජා අයිතිය:** බාහිර සන්දර්භ හරහා නොව ප්‍රජාව තුළින්ම විසඳුම් සකස් කිරීම වැදගත් වේ. ප්‍රාදේශීය සංස්කෘතික හා ආගමික නායකයින්, අධ්‍යාපනඥයින් සහ ක්‍රියාකාරීන් විසින් මෙහෙයවනු ලබන සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රජා මට්ටමේ සංවාද මෙන්ම මේ සම්බන්ධයෙන් වන ප්‍රජා මූලික විසඳුම් උත්පාදනය කිරීම අවශ්‍ය වේ.

- **නිර්මාණාත්මක ප්‍රකාශන හරහා සවිබල ගැන්වීම:** කවි ලිවීමේ වැඩමුළු වැනි විවිධ නිර්මාණාත්මක ක්‍රම භාවිතා කිරීම, ස්වයං ප්‍රකාශනය දිරිමත් කිරීම, ඒකාකෘති වලට අභියෝග කිරීම සහ සමාජ ප්‍රශ්න ගැන මෙනෙහි කිරීම සඳහා ඵලදායී බව පෙන්වා ඇත.

- **ධාරිතා ගොඩනැගීම සහ ප්‍රතිපත්ති වෙනස් කිරීම:** ධාරිතා ගොඩනැගීම සහ ප්‍රතිපත්ති නිර්දේශ සඳහා රජයේ ප්‍රධාන අමාත්‍යවරුන් සමග ඇති කර ගන්නා සහයෝගීතාවය, පද්ධතිමය වෙනස්වීම් වලට බලපෑම් කිරීමේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රවර්ධනය කිරීමේ ඵලදායී ක්‍රම විය හැක. කෙසේ වෙතත්, බොහෝ විට නියාමන බාධාවන් සහ සමාජීය බලපෑම් හේතුවෙන් වෙනස්කම් පිළිගැනීමට සහ වැළඳ ගැනීමට හෝ නව ප්‍රවේශයන් අනුගමනය කිරීමට රාජ්‍ය ආයතන තුළ පවතින අතිමහත් අකමැත්ත පිළිගැනීම ඉතා වැදගත් වේ.


- **අන්තර් විනය ප්‍රවේශය:** ස්ත්‍රී පුරුෂ භාවය සහ ප්‍රචණ්ඩත්වය වැනි සමාජ ගැටලු බහුවිධ කාචයක් හරහා විමර්ශනය කිරීම ඉතා වැදගත් වන්නේ එය ගැඹුරු ගැටලුවලට මූලික වන හේතු පිළිබඳව වඩාත් නිවැරදි සහ ගතික අවබෝධයක් ලබා දෙන බැවිනි. මීට අමතරව, අන්තර්විනය සහයෝගීතාවයන් පෝෂණය කිරීම දෘෂ්ටිකෝණ පොහොසත් කිරීමට සහ එක් එක් ව්‍යාපෘතියේ සමස්ත බලපෑම වැඩි දියුණු කිරීමට උපකාරී වන අතර ව්‍යාපෘති අතර අනුපිටපත් නිර්මාණය වීම වලකයි.

- **ඒකාබද්ධ උත්සාහය:** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම රාජ්‍ය නොවන සංවිධානවල සහ ක්‍රියාකාරීන්ගේ පමණක් වගකීමක් නොවන අතර ප්‍රජා සහභාගීත්වයෙන් තොරව එය කළ නොහැකිය. ඵලදායී ප්‍රවේශයක් සඳහා රජය, රාජ්‍ය නොවන සංවිධාන, අරමුදල් සපයන්නන්, පරිත්‍යාගශීලීන්, මාධ්‍ය සහ පුළුල් ප්‍රජාවේ ඒකාබද්ධ උත්සාහය අවශ්‍ය වේ.

- **COVID-19 හි බලපෑම:** COVID-19 ගෝලීය වසංගතය කාන්තාවන්ට සහ විවිධ ලිංගික දිශානතීන්ට, විවිධ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයන්ට, විවිධ ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය කිරීම් වලට සහ විවිධ ලිංගික ලක්ෂණ සහිත පුද්ගලයන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැඩි වීමට හේතු විය.

.

## සංක්‍රමණය සහ අවතැන් වීම



මෙම ප්‍රවාහයේ ව්‍යාපෘති මැදපෙරදිග සහ දකුණු ආසියාවේ විවිධ අභ්‍යන්තර හා ජාත්‍යන්තර අවතැන්වීම් සහ සංක්‍රමණය වීම් වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පැතිකඩවල් විශ්ලේෂණය කරන අතර ජාත්‍යන්තර මට්ටමින් ඉහළ සිට පහළට යන කතිකාවත් සහ මුලපිරීම්වලින් ඔබ්බට ගොස් ප්‍රජා කණ්ඩායම් සහ ප්‍රාදේශීය සංවිධාන හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීමේ ප්‍රතිපත්ති සැකසීමට නිර්දේශ ඉදිරිපත් කරයි. ප්‍රවාහයේ ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ පහත සඳහන් වේ.

- සෞඛ්‍ය හා අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ විෂමතාව: සෑම සන්දර්භයක් තුළම සෞඛ්‍ය හා අධ්‍යාපනයට අදාළ ගැඹුරු ස්ත්‍රී පුරුෂ වෙනස්කම් පවතින අතර අවතැන් වූ කණ්ඩායම්වලට පිරිසිදු ජලය, සනීපාරක්ෂක ජීවන තත්වයන් සහ ප්‍රජනක සෞඛ්‍ය සඳහා ප්‍රවේශයන් නොමැත.

- **පුහුණු කිරීම සහ සන්නිවේදනය:** අවතැන් වීම, ආපසු පැමිණීම සහ සංක්‍රමණ ප්‍රතිපත්ති සැකසීමේදී, ස්ත්‍රී පුරුෂ සමාජභාවය විශ්ලේෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමින් සහ ජාතික සහ පළාත් පාලන ආයතන මටටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් ප්‍රතිපත්ති පිළිබඳ වඩා හොඳ පුහුණුවක් සහ සන්නිවේදනයක් ලබා දීම අවශ්‍ය වේ.

- **ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:** ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් ප්‍රතිපත්ති සහ අවතැන් වීම පිළිබඳ පුහුණුව වඩා හොඳින් ක්‍රියාත්මක කළ යුතුය.

- **නැවත පැමිණීම සඳහා වන පෙළඹවීම:** විදේශ රට වලට සංක්‍රමණය වුවත් නැවත මවු රටට පැමිණීමට බලපාන සාධක වන්නේ සත්කාරක රටෙහි අත් විඳීමට ලක් වූ දුර්වල ජීවන තත්වයන්, වර්ගවාදය සහ වෙනස් කොට සැලකීම (විශේෂයෙන් COVID-19 වසංගතය සමයේදී උත්සන්න වූ) සහ මුල් රටෙහි සමාජ ආර්ථික තත්වයන්ගේ වර්ධනය නිසා ආපසු පැමිණීම ශක්‍ය හෝ ලාභදායී දෙයක් වීම.

- **ආපසු පැමිණීමේ ප්‍රතිපත්ති සහ සහාය නොමැතිකම:** ශ්‍රම වෙළඳපොලේ අවස්ථා සහ නිවාස සහ අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පිළිබඳ ගැටළු ඇති පරිසරයක නැවත පැමිණීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ ආධාර නොමැතිකම නිසා සමහර සංක්‍රමණිකයන්ට තම මව්බිමට ආපසු පැමිණීම අසීරු වේ.

- **බඳවා ගැනීමේ නියෝජිතායතනවල බලය:** විශේෂයෙන් ලෙබනනය වැනි කෆාලා පද්ධති ඇති රටවල සංක්‍රමණික කාන්තාවන් මුහුණ දෙන තත්වයන් සහ සංක්‍රමණයට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් බඳවා ගැනීමේ ආයතන සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

- **අසමානතාවය සහ ප්‍රචණ්ඩත්වය:** ව්‍යුහාත්මක අසමානතා සහ ප්‍රචණ්ඩත්වය සංක්‍රමණ සන්දර්භය තුළ කාන්තා නියෝජිතායතනය හීන කරන අතර ශ්‍රම වෙළඳපොලවල නියැලීමට ඔවුන්ගේ ඇති හැකියාවට බාධා කරයි.

- **පර්යේෂණ පරතරයන්:** ගෝලීය දකුණ තුල සිදුවන සංක්‍රමණයන් වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය බලපාන විවිධ ආකාර ගවේෂණය කිරීමට තවත් පර්යේෂණ අවශ්‍ය වේ. මීට අමතරව, සම්මත කම්කරු නීති මගින් ආරක්ෂා කර නොමැති ගෘහ සේවිකාවන්ගේ ජීවන සහ සේවා කොන්දේසි වැඩිදියුණු කිරීම සඳහා තවත් බොහෝ දේ කළ යුතුය. මෙම තත්වයන් තුළ සංක්‍රමණික කාන්තාවන්ගේ සැබෑ ජීවිත අත්දැකීම් සහ අනන්‍ය අවශ්‍යතා වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට ප්‍රජා කණ්ඩායම් සමඟ වැඩ කිරීම අවශ්‍ය වේ.

## නීතිය සහ ප්‍රතිපත්ති රාමු



මෙම ප්‍රවාහය දේශීය සහ ජාත්‍යන්තර ප්‍රතිපත්ති අතර සම්බන්ධතා විමර්ශනය කරන අතර ජාත්‍යන්තර මට්ටමින් ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සහ භාවිතයන් ගෝලීය උතුර සහ ගෝලීය දකුණ යන දෙකෙහිම රටවලට බලපාන ආකාරය විශ්ලේෂණය කරයි. මෙම ප්‍රවාහයේ ව්‍යාපෘති සංක්‍රාන්ති යුක්තිය සහ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන පරිත්‍යාගශීලීන්ගේ ප්‍රතිපත්ති, ආයතනික ව්‍යුහයන් සහ අරමුදල් රටා වල බලපෑම් පිළිබඳ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත රැස් කරන අතර, සහ පරිවර්තනීය ගැටුම් නිරාකරණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සංවේදී ආරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳව ඇති වාර්තා පරීක්ෂා කරයි. ප්‍රවාහයේ ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ පහත සඳහන් වේ.

- **ස්ත්‍රී පුරුෂ භාවය යනු කාන්තාවන් සඳහා වන සමානාර්ථපදය පදයක් නොවේ:** බොහෝ අවස්ථාවලදී ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ දෘෂ්ටිකෝණයන්  තවමත් පසෙකට කර ඇති අතර, ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ දත්ත විසන්යෝජනත් සඳහා ප්‍රමුඛත්වයක් ලබා නොදෙයි. මෙයට හේතුව වන්නේ කාන්තාවන් පිළිබඳ සොයා බැලීම තුළින් සාමය සහ යුක්තිය ක්‍රියාවලීන්හි ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීමක් වන බව උපකල්පනය කිරීමයි.

- **ස්ත්‍රීපුරුෂභාවය ප්‍රතිපත්ති මත සිදු කරන බලපෑම්:** ජාත්‍යන්තර මට්ටමින් ප්‍රතිපත්තිවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සාධාරණත්වයට ප්‍රමුඛතාවය ලබා දීමක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පිළිබඳ වන ඇඟවුම් ගැන සැලකිල්ලක් දක්වනු ලැබුවද, බොහෝ දේශීය හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් තවමත් ගැඹුරින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලපෑම් ඇති කරයි.

- **භාෂා කරුණු:** හැකි සෑම විටම 'යුක්තිය,' 'සාම කාලය,' සහ 'පශ්චාත් ගැටුම්' වැනි ප්‍රධාන සංකල්ප පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ පොදු අවබෝධය වර්ධනය කර ගැනීමට උපකාර කිරීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, මෙය කළ යුත්තේ කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව යන 'ප්‍රතිපත්ති පරිසර පද්ධතිය' මෙම හවුල් අර්ථයන් වටා ඒකාබද්ධ කළ හැකිද හෝ කළ යුතුද යන්න පිළිබඳව සෞඛ්‍ය සම්පන්න සංශයවාදයක් පවත්වා ගනිමින් ය.


- **නිශ්ශබ්දතාවය ද වැදගත් ය:** පර්යේෂකයන් ප්‍රතිපත්ති සාකච්ඡාවලදී කතා කිරීමට අවස්ථාව ලැබෙන අය, ඔවුන් කතා කිරීමට තෝරා ගත්තේ කුමන මාතෘකාද සහ මෙම සාකච්චා වලදී කුමන පුද්ගලයින් සහ මාතෘකා නිශ්ශබ්ද කර ඇත්ද යන්න පිළිබඳව අවධානයෙන් සිටිය යුතුය.

- **ප්‍රාදේශීය හඬවල් විස්තාරණය කරන්න:** ගැටුම් සහ ගැටුම් වල බලපෑම් වලට ලක්වූ පසුබිම්වලදී, බිම් මට්ටමේ සාමය සහ යුක්තිය පිළිබඳ සේවාවන් ඉටු කරන සංවිධාන දැනුම ඇත්තන් වන අතර ඒවා අගය කළ යුතුය. බල අසමතුලිතතාවය සහ අරමුදල් හිඟය ප්‍රාදේශීය සංවිධානවලට අසමාන ලෙස බලපාන අතර ඔවුන්ගේ තීරණ ගැනීමේ අවකාශයන් සීමා කරනු ලබයි. ඒ අතරම මෙය ගෝලීය උතුරේ ක්‍රියාකාරීන් වෙත වරප්‍රසාද ලබා දෙයි.

- **ප්‍රාදේශීය-ජාතික-ගෝලීය විසන්ධිය:** ප්‍රධාන ප්‍රතිපත්ති රාමුවල දේශීය හා ජාත්‍යන්තර අංශ බොහෝ විට හොඳින් සම්බන්ධ වී නොමැති අතර දේශීය ක්‍රියාකාරීන් ඔවුන්ගේ එදිනෙදා වැඩවලදී කාන්තාවන්, සාමය සහ ආරක්ෂාව පිළිබඳ න්‍යාය පත්‍රය වැනි ජාත්‍යන්තර රාමු ප්‍රයෝජනයට නොගනී.

- **වගකීම් සහගත, විනිවිද භාවයෙන් යුත් සහ සහභාගීත්ව අරමුදල්:** ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ට, විශේෂයෙන් පරිත්‍යාගශීලීන්ට, පශ්චාත් ගැටුම් පරසර වල සිදු කරන යුක්තිය සහ සංහිඳියාව පිළිබඳ කටයුතු සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කල හැකි මුත්, ඔවුන්ගේ අරමුදල් පිළිබඳ දත්ත සඳහා ඇති ප්‍රවේශය දුර්වල ය.

# ක්‍රමවේද නවෝත්පාදනය



මෙම ව්‍යාපෘති නව්‍ය ක්‍රමවේද ප්‍රගමනය තුළින් වඩාත් ඔරොත්තු දෙන, සාධාරණයි සහ සාමකාමී සමාජයන් ඇති කිරීම සඳහා දායක වීම අරමුණු කරයි. ඔවුන් සැමවිටම ශක්තිමත් සදාචාරාත්මක මූලධර්මවලට අනුගත වන අතරම වෙනස්වන සන්දර්භයන්ට අනුවර්තනය වන ස්ත්‍රීවාදී සහභාගීත්ව සහ සහයෝගී ප්‍රවේශයන් වර්ධනය කරයි. ප්‍රවාහයේ ප්‍රධාන සොයාගැනීම් සහ නිර්දේශ පහත සඳහන් වේ.

- **ස්වයං දැනුවත්භාවය සහ සබඳතා ගොඩනැගීම:** මෙම පර්යේෂණ ක්ෂේත්‍රය තුළ ස්වයං දැනුවත්භාවය සහ සබඳතා ගොඩනැගීම ඉතා වැදගත් වේ. ක්‍රමවේද විශේෂිත සන්දර්භයන්ට ගැළපෙන, ගැටුම්වලට සංවේදී, සහ සැලකිල්ලෙන් සහ සහයෝගීතාවයෙන් සැලසුම් කළ යුතුය. පර්යේෂකයන් දැනුම සාමූහිකව වර්ධනය වන බව හඳුනා ගනිමින් ඔවුන් සහයෝගය දැක්වීමට ඉලක්ක කරන ප්‍රජාවන් සමඟ සමීපව කටයුතු කළ යුතුය.
- **පර්යේෂණ සඳහා අර්බුදවල බලපෑම:** COVID-19 වසංගතය, අයවැය කප්පාදු සහ දේශපාලන නැගිටීම් වැනි අර්බුද පර්යේෂණ ක්‍රමවේදවල සහ සදාචාරාත්මක රාමුවල ඔරොත්තු දීමේ හැකියාවට අභියෝග කරයි. මෙම අභියෝගවලට අනුවර්තනය වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට පර්යේෂකයන් සූදානමින් සිටිය යුතුය.
- **නවෝත්පාදන ක්‍රමවේද:** සහභාගීත්ව චිත්‍රපට නිෂ්පාදනය සහ කලාව පදනම් කරගත් ප්‍රවේශයන් වැනි නව්‍ය ක්‍රමවේද භාවිතා කිරීම හෝ සාමාන්‍යයෙන් පරේය්ෂණ ව්‍යාපෘතියකට සහභාගී වීමට නොහැකි පුද්ගලයින් සමඟ මාර්ගගත සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, පරේය්ෂණයන්ගේ බලපෑම සහ ප්‍රවේශය වැඩි දියුණු කරන අතර විවිධ ප්‍රේක්ෂකයින් අතර අවබෝධය පෝෂණය කරයි.
- **සහභාගීත්ව සහ කලාව පදනම් කරගත් ක්‍රම භාවිතය:** ගැටුම් වල බලපෑම් වලට ලක්වූ ප්‍රජාවන්ට ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා මෙම ප්‍රවේශයන් ගැටුම්-බලපෑ සන්දර්භයන් තුළට ඒකාබද්ධ කළ යුතු අතර, එය වඩාත් සදාචාරාත්මක හා ඵලදායි පර්යේෂණවලට මග පාදයි.
- **දත්ත එකතු කිරීමේ ප්‍රයත්නයන් වැඩි දියුණු කිරීම:** දත්තවල ප්‍රධාන හිඩැස් ආමන්ත්‍රණය කිරීමට සහ සමාජ යහපැවැත්ම සහ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමට, විශේෂයෙන් අඩු ආදායම්ලාභී පරිසරවල දත්ත රැස්කිරීම් වල සිදු කරන ආයෝජනයන් වැඩි කළ යුතුය. ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ අනෙකුත් ප්‍රධාන ඡේදනය වන ප්‍රවර්ග පිළිබඳ විසංයෝජනය කළ දත්ත වහා අවශ්‍ය වේ.

# නව ඉදිරි මාර්ග

> "
> **ඔබට ජීවත් විය නොහැකි ලෝකයන් බිඳ දමනවා සේම, ඔබට නොමැතිව ජීවත් විය නොහැකි ලෝකයන් සිතින් මවා ගැනීමට සහ සැකසීමට මතක තබා ගන්න."**
>
> රූහා බෙන්ජමින්, ඉමැජිනේශන්: අ මැනිෆෙස්ටෝ, 2024.

වාර්තාවේ තුන්වන කොටස විද්වතුන්, වෘත්තිකයන්, නීති සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සාමය සඳහා  කටයුතු කරන ක්‍රියාකාරීන් සඳහා නව ඉදිරි මාර්ග ඉදිරිපත් කරයි. දහවන පරිච්ඡේදය වෙනස් කිරීම සඳහා ආදර්ශයක් ලෙස කේන්ද්‍රය විමර්ශනය කරයි. එහිදී කේන්ද්‍රයේ අන්තර් විනය, අන්තර්ජාතික සහ සහයෝගී ස්ත්‍රීවාදී ප්‍රවේශය සංකීර්ණ, අන්තර් සම්බන්ධිත අභියෝගවලට මුහුණ දීමට උපකාරී වන්නේ කෙසේදැයි ගවේෂණය කරයි. කේන්ද්‍රයේ ස්ත්‍රීවාදී ආකෘතිය, භාවිතයන් සහ ආචාර ධර්මවල වාසි, දුර්වලතා, අභියෝග සහ අවදානම් පරීක්ෂා කරනු ලබන අතර, හඳුනාගත් අභියෝග විසඳීමට උපාය මාර්ග දෙකක් යෝජනා කරනු ලැබේ 1) පරිපූර්ණ ස්ත්‍රීවාදී පරේයේෂණ ඒකාබද්ධ කිරීම සහ 2) ඝර්ෂණය අපේක්ෂා කිරීම සහ ආමන්ත්‍රණය කිරීමපීතෘමූලිකත්වය, ධනවාදය, යටත්විජිතවාදය සහ මිලිටරිවාදයේ සම්බන්ධතාවයට මුහුණ දීමට කේන්ද්‍රය වැනි ජාලයන්ට හැකි වන්නේ විනය, ජාතික-රාජ්‍ය රේඛා සහ ශාස්ත්‍රීය-ක්‍රියාකාරී භේද හරහා දැල් විය ගන්නා විට පමණි.

නිර්මාණයේ සිට ප්‍රතිඵල බෙදාගැනීම දක්වා පරේයේෂණයේ සෑම අදියරකදීම ස්ත්‍රීවාදය යෙදීමේ ප්‍රතිලාභ කේන්ද්‍රස්ථානයේ කාර්යය මගින් පෙන්වයි. ස්ත්‍රීවාදී ආචාර ධර්ම සහ දැනුම සඳහා වූ විවිධ ප්‍රවේශය, කේන්ද්‍රයේ බොහෝ අංශවලට බලපෑම් කිරීමට ස්ත්‍රීවාදයට ඉඩ දුන්නේය. කේන්ද්‍රයේ අත්දැකීම ඝර්ෂණය අපේක්ෂා කිරීමේ සහ යෙදවීමේ වැදගත්කම ද අවධාරණය කරයි. ස්ත්‍රීවාදී පරේයේෂකයන් ඝර්ෂණය සඳහා සැලසුම් කළ යුත්තේ බාහිර තර්ජන සහ අභියෝග මෙන්ම අභ්‍යන්තර එකඟ නොවීම් සහ ආරවුල් ආමන්ත්‍රණය කිරීම සඳහා පැහැදිලි සහ සහයෝගීව සංවර්ධනය කරන ලද ප්‍රතිපත්ති සහ ආධාරක ව්‍යුහයන් තුළ මුල් බැස ගත් නිර්මාණාත්මක ගැටුම් සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීමෙන්ය. එසේ කිරීම සඳහා ඝර්ෂණය නිර්මාණාත්මක බලවේගයක් ලෙස, අභියෝග ආලෝකවත් කරන සහ නව හැකියාවන් හෙළි කරන නිර්මාණාත්මක ශක්තියක් ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා සහයෝගීතාවයේ සහ ආදරණීය වගවීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වේ.

11 වන පරිච්ඡේදය කේන්ද්‍රස්ථානයේ සමස්ත දැක්ම ගවේෂණය කරන අතර රැඩිකල් ලෙස පරිවර්තනය වූ අනාගතයක් සඳහා ක්‍රියා කිරීමට කැඳවයි. එම අනාගතය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අයිතිවාසිකම්, ගරුත්වය, ප්‍රචණ්ඩත්වය නොමැතිකම, ආර්ථික, වාර්ගික සහ යටත් විජිත යුක්තිය, ව්‍යුහාත්මක වෙනස්කම්, සමාජ වෙනසක් සඳහා වන ගෝලීය ව්‍යාපාර, ශක්තිමත් නීති සහ ප්‍රතිපත්ති, සියල්ලන් සම්බන්ධ සාමය ගොඩනැගීම්, ඉහළ මට්ටමේ විශ්වාසය, සහ සාධාරණ දේශපාලනය වැනි සාධකයන්ගෙන් සමන්විතය. අප සිතන අනාගතය කරා යන මාවත ආලෝකවත් කරන කේන්ද්‍රයේ සාමූහික කාර්යයෙන් මතු වූ මූලධර්ම නවයක් පරිච්ඡේදයේ දක්වා ඇත. එම මූලධර්ම පහත සාරාංශ කර ඇත.

## කේන්ද්‍රයේ ආවර්ජන සහ නිර්දේශ

| | | |
|---|---|---|
| තවත් හොඳින් සවන් දෙන්න | ස්ත්‍රී පුරුෂ භාවය ගැන දිගටම කතා කරන්න | ව්‍යුහාත්මක ගැටළු නම් කරන්න |
| ස්ත්‍රීවාදී දැල් වියන්න | සංවිධානය අපේක්ෂා කරන්න, සංවිධානයේ නියැලෙන්න | ක්‍රියාකාරීවාදය කේන්ද්‍රගත කරන්න |
| ක්‍රියාත්මක කිරීමේ හිඩැස් වසන්න, අරමුදල් යොදවන්න | කලාව සහ සංස්කෘතිය අන්තර්ගත කරන්න | සාක්ෂි පදනම පුළුල් කරන්න, සම්බන්ධ කරන්න, සන්නිවේදනය කරන්න |

### 1. තවත් හොඳින් සවන් දෙන්න

ප්‍රථමයෙන් සහ ප්‍රධාන වශයෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසාධාරණය සහ අනාරක්ෂිත බව නිසා වඩාත් පීඩාවට පත් වූවන්ට සවන් දෙන්න.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යුක්තිය ඉටු කිරීමේදී කාන්තාවන්ගේ සහ ආන්තික කණ්ඩායම්වල හඬ සහ ජීවන අත්දැකීම් කේන්ද්‍රගත කිරීම ප්‍රමුඛස්ථානයේ පැවතිය යුතුය. තවද, දැනට පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යුක්තිය පිළිබඳ ජාල සහ හිතවතුන්ගේ බුබුලුවලින් ඔබ්බට ගිය දෘෂ්ටිකෝණය පරාසයකට සවන් දීමේ අවශ්‍යතාවක් පවතී. සවන්දීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, අවධානය යොමු කළ යුත්තේ වඩාත් පීඩාවට පත් වූවන්ගේ විශේෂඥභාවය සහ අත්දැකීම් කේන්ද්‍රගත කරන සහ සමාජ විපර්යාස ක්‍රියාවලියට සුදුසු පාර්ශවකරුවන්ගේ පුළුල් සන්ධානයකට ආරාධනා කරන වඩාත් ඇතුළත් සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියක් සඳහා වැදගත් මාර්ගයකටය.

### 2. ස්ත්‍රී පුරුෂ භාවය ගැන දිගටම කතා කරන්න

ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳව බැරෑරුම් ලෙස සිතන්න. තවත පුද්ගලික, දේශපාලනික සහ වෘත්තීයමය කතිකාවන්හිදී ඒ පිළිබඳව කතා කරන්න.

නීතිය සහ ප්‍රතිපත්ති සම්පාදනය, පර්යේෂණ සහ ක්‍රියාකාරීත්වය වැනි සන්දර්භයන් තුළ ස්ත්‍රී පුරුෂ භාවය ගැන කතා කිරීම නොසන්සුන්තත්වයන්ට තුඩු දිය හැකි නමුත්, එවැනි නොසන්සුන්තත්වයන් අවශ්‍ය වන අතර සමාජ හා දේශපාලන වෙනසක් ඇති කිරීම සඳහා ඒවා හේතු විය හැකිය. ස්ත්‍රී පුරුෂ භාවය අවිකරණය වී ඇති සහ පුරුෂාධිපත්‍යය පිළිබඳ විවේචනාත්මක කතිකාවත් තිහඬ කර ඇති දැඩි ස්ත්‍රී විරෝධී ව්‍යාපාරවල නැගීම මධ්‍යයේ සහ අවධානය සහ සම්පත් වෙනතකට යොමු කර ඇති පරසර තත්වයක ස්ත්‍රී පුරුෂ භාවය ගැන කතා කිරීම විශේෂයෙන් වැදගත් වේ.

### 3. ව්‍යුහාත්මක ගැටළු නම් කරන්න

පුරුෂාධිපත්‍යය, ධනවාදය, යටත්විජිතවාදය සහ මිලිටරිවාදය යන ගැටලු ප්‍රසිද්ධියේ නම් කළ යුතුය, මන්ද නොකියන දේ බොහෝ විට ප්‍රශ්න කිරීමට ලක් නොවනු නිසාය.

ස්ත්‍රීවාදී පර්යේෂණ භාෂාව වැදගත් වන ආකාරය සහ සමාජ ගැටලු පිළිබඳව අප පවසන කථා අපගේ සමාජ ලෝකයන් සහ පරිකල්පනයන් හැඩගස්වන්නේ කෙසේද යන්නත් එය අප සිතන හා ක්‍රියා කරන ආකාරය කෙරෙහි බලපාන බවත් දිගුකාලීනව න්‍යායික හා ප්‍රායෝගික අවබෝධයක් ලබා දී ඇත. පීතෘමූලිකත්වය, ධනවාදය, යටත්විජිතවාදය සහ මිලිටරිවාදය යන නොබිඳිය හැකි සහ අන්තර් සම්බන්ධිත ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයන් ආමන්ත්‍රණය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ මෙම ප්‍රචණ්ඩත්වය සෘජුව ආමන්ත්‍රණය කිරීමට හැකි දේශපාලන ධෛර්යයක් අවශ්‍යය වේ.

### 4. ස්ත්‍රීවාදී දැල් වියීම

පීතෘමූලිකත්වය, ධනවාදය, යටත්විජිතවාදය සහ මිලිටරිවාදය යන නොබිඳිය හැකි අභියෝග අන්තර් සම්බන්ධිත වන අතර එකක් මත එකක් රඳා පවතී. ඒවා ආමන්ත්‍රණය කිරීමේ ප්‍රවේශයන් අන්තර් ඡේදනය, සමමුහුර්ත සහ සාකල්‍ය විය යුතුය.

අන්තර් විශ්ලේෂණ, අන්තර් ජාතික හවුල්කාරිත්වය, අන්තර් විනය ක්‍රම සහ බහු-අංශක සහයෝගිතා හරහා විශාරදයින්, වෘත්තිකයන්, ක්‍රියාකාරීන් සහ නීති සහ ප්‍රතිපත්ති සම්පාදකයින් බහුවිධ දෘෂ්ටිකෝණයන් සහ ප්‍රවේශයන් හරහා සම්බන්ධ කිරීම කෙරෙහි දැල් වියමන අවධානය යොමු කරයි. පර්යේෂණ ක්‍රියාවලියේ සෑම පියවරකදීම ස්ත්‍රීවාදී චින්තනයේ සහ භාවිතයේ සාකල්‍ය යෙදුමක වටිනාකම සහ සත්කාර සහ ප්‍රජා ගොඩනැගීමේදී ස්ත්‍රීවාදී ආචාර ධර්ම ප්‍රමුඛ වන ආකාරය ද එය පෙන්වා දෙයි. කේන්ද්‍රය වැනි මහා පරිමාණ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ව්‍යාපෘතිවලින් උගත් පාඩම් ඉදිරියේදී විවිධ පරිමාණයන්ගෙන් ප්‍රතිනිර්මාණය කළ හැකි බව සහතික කිරීම සඳහා පරිත්‍යාගශීලීන් සහ අරමුදල් සපයන ආයතන සමඟ සම්බන්ධ වී සැලකිය යුතු කාර්යයක් කළ යුතුව ඇත.

## 5. සංවිධානය අපේක්ෂා කරන්න, සංවිධානයේ නියැලෙන්න .

ස්ත්‍රීවාදී පර්යේෂණයන් මගින් බාහිර තර්ජන හා අභියෝග අවම කිරීම අවශ්‍ය වන අතර අභ්‍යන්තර සංවිධාන සහ පරස්පර මතගැටීම් වල නිර්මාණාත්මක නියැලීම අවශ්‍ය වේ.

ස්ත්‍රීවාදී පර්යේෂකයන්ට ක්‍රියාශීලී ලෙස බාහිර අභියෝග සහ ප්‍රතිරෝධයන් අපේක්ෂා කිරීම සහ හැසිර වීම සිදු කල යුතුය. මෙයට ව්‍යාපෘති සහ අවදානම් කළමනාකරණය කිරීම සඳහා කාලය, අරමුදල් සහ විශේෂිත දැනුම ආයෝජන කිරීම සහ ව්‍යාපෘති, ආයතන, සහ අරමුදල් සපයන්නන් අතර දැනට පවත්නා බල සබඳතා විශ්ලේෂණය කිරීම ඇතුළත් ය. ඵලදායි ස්ත්‍රීවාදී පර්යේෂණවලට ස්ත්‍රීවාදී සත්කාර ආචාර ධර්ම වැලඳගැනීම, සබඳතාවලට ප්‍රමුඛත්වය දීම, සානුකම්පිත වගවීම තුලින් ප්‍රතිරෝධය තුලනය කිරීම සහ නිර්මාණාත්මක ගැටුම් නිරාකරණය කිරීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම මගින් අභ්‍යන්තර අභියෝගවලට විසඳුම් සෙවීම ඇතුළත් වේ.

## 6. ක්‍රියාකාරීවාදය කේන්ද්‍ර ගත කිරීම

ස්ත්‍රීවාදී ක්‍රියාකාරීවාදය හඳුනාගෙන එයට සහාය දැක්වීම සහ එය ස්ත්‍රීපුරුෂ යුක්තිය පිළිබඳ පර්යේෂණ, ක්‍රියාකාරීවාදය, නීතිය සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී හදවතේ තබා ගන්න.

බිම් මට්ටමේ ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ ක්‍රියාකරීවාදය සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු අතර එයට අරමුදල් සැපයීම සහ රැක බලා ගැනීම සිදු කළ යුතුය. සියල්ල ඇතුලත් සාමය ගොඩ නැගීම සඳහා එකවර ඉහළ මට්ටමේ හා පහළ මට්ටමේ ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන අතර පහළ මට්ටමේ ප්‍රවේශයන් අවම කිරීම හෝ නිත්‍යානුකූල නොකිරීම වැලකීම ඉතා වැදගත් වේ. එසේ කිරීමට ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික ප්‍රජා සංවිධානයන්ගේ ආයෝජන කිරීම අවශ්‍ය වේ. තවද එවැනි භූමිකාවන්ගේ නියැලීම් අගය කළ යුතු අතර සම්බන්ධ වූවන්ට එය ස්ථාවර සහ තිරසාර කාර්යයක් විය යුතුය.

## 7. ක්‍රියාත්මක කිරීමේ හිඩැස් වසන්න, අරමුදල් යොදවන්න

භාෂාව වැදගත් නමුත් ක්‍රියාව වඩාත් වැදගත් වේ.

සමහර ක්ෂේත්‍රවලට නව නීති සහ ප්‍රතිපත්ති අවශ්‍ය විය හැකි නමුත්, තිරසාර සංවර්ධන ඉලක්ක සහ කාන්තා, සාමය සහ ආරක්ෂක න්‍යාය පත්‍රය ඇතුළුව පවත්නා නීතිමය සහ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සියල්ල ඇතුලත් සාමය සම්බන්ධයෙන් වන ප්‍රගතිය සැලකිය යුතු ලෙස වේගවත් කරනු ඇත. මේ සඳහා වඩාත් අර්ථවත්, තිරසාර සහ විවිධ භාවයෙන් යුත් අරමුදල් අවශ්‍ය වේ. බොහෝ විට, බලයේ සිටින අයගෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඇති කතිකාව ප්‍රත්‍යක්ෂ කළ හැකි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ප්‍රමාණවත් අරමුදල් බවට පරිවර්තනය වීමට අසමත් වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාවන් අවශ්‍ය වන අතර ක්‍රියාවන් සඳහා සම්පත් අවශ්‍ය වේ.

## 8. කලාව සහ සංස්කෘතිය අන්තර්ගත කරන්න

කලාව සහ සංස්කෘතිය ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ යුක්තිය සහ ආරක්ෂක කටයුතුවලට අත්‍යවශ්‍ය අංග වන අතර ව්‍යාපෘති, ව්‍යාපාර සහ වෙනස්වීම් පිළිබඳ න්‍යායන් වලට අර්ථවත් ලෙස ඒකාබද්ධ කළ යුතුය.

කලාව හා සංස්කෘතික භාවිතයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ යුක්තිය පිළිබඳ කාර්යයේ උපාය මාර්ගික සංරචක ලෙස දැකිය යුතු අතර නිර්මාණාත්මක වෘත්තිකයන් සහ පුළුල් මහජනතාව ඇතුළු විවිධ ප්‍රේක්ෂකයින් සම්බන්ධ කර ගැනීමට භාවිතා කළ හැකි මාර්ගයක් ලෙස දැකිය යුතුය. කලාත්මක හා සංස්කෘතික ප්‍රවේශයන් අධ්‍යාපනය, විශ්ලේෂණය, ක්‍රියාවලියට නැගීම, සුව කිරීම, සම්බන්ධ කිරීම, ප්‍රකාශ කිරීම, බෙදා හැරීම, යුක්තිය සෙවීම, සමාජ වෙනසක් ඉදිරියට ගෙනයාම සහ නව රැඩිකල් ලෙස පරිවර්තනය වූ අනාගතයක් අපේක්ෂා කිරීම සඳහා භාවිතා කල හැකි ප්‍රතිචාරාත්මක සහ බහුමාන මාර්ග විය හැකිය. එම නිසා, කලාව අත්‍යවශ්‍ය දෙයක් මිස අමතර උපාංගයක් නොවේ.

## 9. සාක්ෂි පදනම පුළුල් කරන්න, සම්බන්ධ කරන්න, සන්නිවේදනය කරන්න

වඩාත් ඵලදායි ස්ත්‍රීවාදී පර්යේෂණ අවශ්‍ය වන අතර ඒ සමගම ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙන් මත වෙන් වූ දත්ත, සමානාත්මතාවයෙන් යුත් දැනුම හුවමාරු කිරීමේ හවුල්කාරිත්වයන් සහ පර්යේෂණ සන්නිවේදන උපාය මාර්ග අවශ්‍ය වේ.

කේන්ද්‍රයේ කාර්යය තුලින් මතුව ඇති පුළුල් පරාසයක ප්‍රධාන ප්‍රශ්න මෙන්ම ස්ත්‍රී පුරුෂ භාවය මත විසංයෝජනය කළ දත්ත නොමැතිකම, ශාස්ත්‍රීය සාහිත්‍යයේ පවතින හිඩැස් සහ මතුවන සමාජ, දේශපාලන සහ තාක්ෂණික අභියෝගවලට විසඳුම් සෙවීමට නව නව පර්යේෂණ අවශ්‍ය වේ. තවද පවතින දැනුම වඩා හොඳින් ඒකාබද්ධ කිරීමට, විනයානුකූල බාධක සහ විද්වතුන් සහ වෘත්තිකයන් අතර පරතරය බිඳ දැමීමට සහ විවිධ පාර්ශවකරුවන්ට දැනුම ඵලදායී හා අර්ථවත් ලෙස සන්නිවේදනය කිරීමට නව උත්සාහයන් අවශ්‍ය වේ.

## රට වලට විශේෂිතවූ ක්‍රියාවයට නැගීමට නිර්දේශ

කේන්ද්‍රස්ථානයේ මූලධර්ම නවය ක්‍රියාත්මක කරමින් රැඩිකල්, ප්‍රත්‍යක්ෂ වෙනසක් ගෙන ඒම සඳහා ගැටුම් වලින් බලපෑමට ලක් වූ සමාජවල සහ ඉන් ඔබ්බට සංයුක්ත ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. කේන්ද්‍රයේ පර්යේෂණ ව්‍යාපෘති කේන්ද්‍රගත ගත වූ රටවලට අදාළ වන සොයාගැනීම් සහ ඒවා මත පදනම්ව පැමිණි නිර්දේශ 3 වන පරිච්ඡේදයේ වඩාත් විස්තරාත්මකව සාකච්ඡා කරන අතර එහි සාරාංශය පහත දැක්වේ.

## ඇෆ්ගනිස්ථානය



ඡායාරූප හිමිකම: ෆරීඩ එර්ශාද්

2021 අගෝස්තු මාසයේදී තලේබාන් සංවිධානය ඇෆ්ගනිස්ථානයේ පාලන බලය අත්පත් කර ගැනීමට පෙර, එරට ව්‍යාපෘතිවල ප්‍රධාන සොයාගැනීම් මගින් භෞතික හා ආර්ථික අනාරක්ෂිත භාවය මෙන්ම, පවතින අර්බුද මධ්‍යයේ කාන්තාවන් සහ ආන්තික කණ්ඩායම් අඛණ්ඩව ජීවනෝපායන් නිර්මාණය කරමින් ප්‍රජාව පෝෂණය කරන ආකාරය ඉස්මතු කළේය. සෞඛ්‍ය, සමාජ හුදකලාව, නෛතික තත්ත්වය සහ අධ්‍යාපනයට සහ රැකියා සඳහා ප්‍රවේශය සම්බන්ධයෙන් වන අවතැන් වීමේ බහුවිධ ස්ත්‍රී පුරුෂ බලපෑම් ද මෙම ව්‍යාපෘති මගින් ලේඛනගත කර ඇත. කෙසේ වෙතත්, තලේබාන් පාලනය යටතේ කාන්තා අයිතිවාසිකම් සහ පොදු ජීවිතයට සහභාගී වීම සම්බන්ධයෙන් ඇති කුරිරු ප්‍රතිපත්ති හේතුවෙන් මෙම නිර්දේශ බොහොමයක් යථාර්ථවාදීව ක්‍රියාත්මක කළ නොහැක. කෙසේ වෙතත්, අනාගත උපදේශනය සඳහා රාමුවක් සැපයීම, සිදු කළ කාර්යය ලේඛනගත කිරීම සහ පෙර සහ දැන් කාන්තා උපදේශනයේ තත්වය ඉස්මතු කර දැක්වීම සඳහා ඒවා මෙහි සඳහන් කෙරේ.

## නිර්දේශ

### 2021 අගෝස්තු දක්වා නිර්දේශ

**ඇෆ්ගනිස්ථාන රජය:**

- **ආර්ථික සවිබල ගැන්වීම:** විශේෂයෙන්ම ශිල්ප කලා අංශයේ අවතැන් වූ කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම සඳහා සහාය වීම සහ පවත්නා වැඩසටහන් සංවර්ධනය කිරීම.
- **අධ්‍යාපනික වැඩසටහන්:** අඩු වයසින් විවාහ වීම වැළැක්වීම සහ ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන අංශයේ වෙනස් කොට සැලකීම අඩු කිරීම: ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය සහ භාෂාව මත පදනම්ව වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීම සඳහා ප්‍රජා අධ්‍යාපන ප්‍රතිපත්ති සහ භාවිතයන් සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම.
- මානසික සෞඛ්‍ය සේවා: අවතැන් වූ ජනගහනයට ප්‍රවේශ විය හැකි මානසික සෞඛ්‍ය සේවා ස්ථාපිත කිරීම සහ මෙම ප්‍රජාවේ සහ ප්‍රජාවේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ඇති සුවිශේෂී ආතතියට තුඩු දෙන සාධක ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.

**එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ මානුෂීය ක්‍රියාකාරීන්:**

- **කාන්තා සෞඛ්‍යය:** ප්‍රසව හා ප්‍රජනක සෞඛ්‍ය සේවා ඇතුළුව කාන්තා සෞඛ්‍ය මුල පිරීම්වලට ප්‍රමුඛත්වය දෙන්න.
- **මූලික අවශ්‍යතා සහ සනීපාරක්ෂාව:** සෞඛ්‍ය අර්බුද අවම කිරීම සඳහා පිරිසිදු ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් පෙනී සිටීම සහ ලබා දීම.
- **සාමය සහ සංහිඳියාව වෙනුවෙන් පෙනී සිටීම:** ඇෆ්ගනිස්ථානයේ සාම ක්‍රියාවලීන් වෙනුවෙන් පෙනී සිටීම, එම ක්‍රියාවලීන් වලට කාන්තාවන් ඇතුළත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම සහ දැනට මේ සම්බන්ධයෙන් අදාළ කුසලතා සහ පළපුරුද්ද ඇති ඇෆ්ගන් ජනතාව සමඟ සම්බන්ධ වීම.
- **අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය සහ යුක්තිය සඳහා ප්‍රවේශය:** කාන්තාවන්ගේ සහ සරණාගතන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සහ අවබෝධය වැඩිදියුණු කිරීම සහ එම අයිතිවාසිකම් සඳහා ප්‍රවේශය සෙවීම සඳහා සහාය ලබා දීම.

**ජාත්‍යන්තර ප්‍රජාව සහ සත්කාරක රටවල්:**

- **ඇෆ්ගන් ජාතික සංක්‍රමණිකයන් සහ විදේශගතව සිට නැවත ඇෆ්ගනිස්ථානයට ආපසු පැමිණි අය සඳහා සහාය ලබා දීම:** රැකියා ස්ථානගත කිරීම, සමාජ ඒකාබද්ධතාවය සහ දරිද්‍රතාවය ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් ඇෆ්ගනිස්ථානයට ආපසු පැමිණි අයට සහ සංක්‍රමණිකයන්ට සහාය වීම.
- **නිපුණතා උපයෝගී කර ගැනීම:** ඔවුන්ගේ සත්කාරක ප්‍රජාවන්ට සහ නිජබිමට ධනාත්මක ලෙස දායක වීමට හැකි ඇෆ්ගන් ජාතික විශේෂඥයන්, විශේෂයෙන් අවතැන් වීමට ලක්වූ විශේෂඥයන්ගේ කුසලතා සහ සුදුසුකම් හඳුනාගෙන ඒවා භාවිතා කරන්න.
- සංක්‍රමණිකයන් සඳහා නීතිමය ආරක්ෂාව සැපයීම: ඇෆ්ගන් සංක්‍රමණිකයන් සඳහා, විශේෂයෙන් කාන්තාවන් සඳහා ඇති නීතිමය ආරක්ෂාව තර කිරීම සහ ඔවුන්ට පොදු සේවාවන් වෙත ප්‍රවේශ වීමට සහ සමාජ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම.

**2021 අගෝස්තු මාසයෙන් පසු නිර්දේශ**

***විදේශ රාජ්‍යන් සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන:***

- **ඇෆ්ගනිස්ථානය තුළ සහ ඩයස්පෝරාවේ සිටින ඇෆ්ගන් ජාතික විශේෂඥයින් සම්බන්ධ කර ගැනීම, සංවිධානය කිරීම සහ බලමුලු ගැන්වීම:** ඔවුන්ගේ නිජබිම සහ අවට කලාපය තුළ ඇෆ්ගනිස්ථානුවන්ට සහාය වීම සඳහා, එක්සත් ජාතීන්ගේ සංවිධානය, සරණාගතයින්සට පහසුකම් සපයන සත්කාරක රටවල් සහ ඇෆ්ගන් ඩයස්පෝරාවේ සංවිධාන ඇෆ්ගන් විශේෂඥයින් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ සමාජ, මානව, සංස්කෘතික සහ ආර්ථික ප්‍රාග්ධනය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති සකස් කළ යුතුය.

- **ඇනහිට ඇති සාම ක්‍රියාවලිය නැවත පන නං වීමට උත්තේජනයක් යොදන්න:** ඇනහිට ඇති සාම ක්‍රියාවලිය ආරම්භ කිරීමට සහ කාන්තාවන් ඇතුළු සමාජයේ සියලු අංග සමඟ සංහිඳියාව ඇති කිරීමට තලේබාන් සංවිධානයට බලපෑම් කිරීමට ජාත්‍යන්තර ප්‍රජාව සතුව ඇති ඕනෑම උත්තෝලනයක් භාවිතා කළ යුතුය.

- **තවමත් කළ හැකි කාර්යය කෙරෙහි අවධානය යොමු කිරීමට සහ සහාය වීමට අවධානය මාරු කරන්න:** වර්තමාන තත්ත්වය තුළ, තවමත් කාන්තාවන්ට ඔවුන්ගේ කුසලතා යොදා ගනිමින් මූල්‍යමය ලාභ ලබා ගැනීමේ ගැනීමේ අවස්ථා පවතී. කාන්තා අයිතිවාසිකම්, ආරක්ෂාව සහ ජීවනෝපායන් කෙරෙහි ගැඹුරු සහ නිරසාර ප්‍රහාරයන් නොතකා, කාන්තාවන් විශේෂයෙන් ඔවුන්ට නිවස තුළ රැඳී සිටීමට ඉඩ සලසන මාදිලිවල දිගටම වැඩ කරති. මෙම කාර්යය ශක්තිමත් කිරීම සඳහා ඇෆ්ගනිස්ථානය සහ පාකිස්තානය අතර වෙළඳ මාර්ග ඉතා වැදගත් වේ. අත්කම් නිෂ්පාදන වැනි භාණ්ඩ අපනයනය කර ආදායම් උපයා ගැනීමට හැකි වන පරිදි මෙම වෙළඳ මාර්ග පවත්වාගෙන යාමට ජාත්‍යන්තර සංවිධාන කටයුතු කළ යුතුය. තවද කාන්තාවන්ට ආදායමක් උපයා ගත හැකි වැඩකටයුතුවලට රාජ්‍ය නොවන සංවිධාන අඛණ්ඩව සහාය දිය යුතුය.

- **දේශපාලන ක්‍රියාවලීන්ට කාන්තාවන් සම්බන්ධ කර ගැනීම සහ සම්බන්ධ කර ගැනීම සඳහා පෙනී සිටීම:** ඇෆ්ගනිස්ථාන කාන්තාවන් ජාත්‍යන්තර ප්‍රජාව විසින් පවත්වනු ලබන ඇෆ්ගනිස්ථානයේ අනාගතය පිළිබඳ සංවාද නියෝජනය නොකිරීමේ අවදානමක් ඇත. ඉදිරි වසරවලදී තලේබාන් සංවිධානය ලෝක සංවිධාන විසින් පිළිගැනීමට ඇති හැකියාව මෙම නියෝජනය නොකිරීම තවත් උග්‍ර කළ හැකි අතර, අනාගත කාන්තා පරම්පරාවන්ට මෙහි ප්‍රතිවිපාක දැරීමට සිදු වේ. එම නිසා සියලුම පරිත්‍යාගශීලීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ඔවුන්ගේ උපදේශනයේදී සහ ප්‍රතිපත්තීන් වල ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය පවත්වා ගත යුතුය.

දැනට පවතින අර්බුද සම්බන්ධයෙන් වන ප්‍රතිචාර ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා හැර ඇති අතර එම නිසා අන්තර් ඡේදන අසමානතා පිළිබඳව දැනුවත් විය යුතුය. 2021 අර්බුදයෙන් හෙළි වූයේ ඉවත් කිරීමේ උත්සාහයන් සහ මානුෂීය වීසා සඳහා ප්‍රවේශය ලබා දීම ඇතුළු ආරක්ෂණ ප්‍රතිපත්ති ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳව නොසලකා හැරි බවය. එමෙන්ම, නැවත පදිංචි කිරීමේ වැඩසටහන් ද ඇෆ්ගනිස්ථානයේ අන්තර් ඡේදනය අසමානතා පිළිබඳ දැනුවත්භාවයේ අඩුවක් පෙන්නුම් කළේය. කෙන්ද්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අන්තර් ඡේදනය කිරීමේ අර්බුද මෙවලම් කට්ටලය මෙම අවබෝධයේ පරතරය ආමන්ත්‍රණය කරන අතර එය වෙනත් සන්දර්භයන් තුළ භාවිතා කළ යුතුය.

## කොලම්බියාව




චිත්‍රය: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය (CC BY-NC-ND 2.0)

කොලොම්බියාවේ ක්‍රියාත්මක ව්‍යාපෘති සාමය සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ විවිධ පැතිවල බලපෑම පරීක්ෂා කරයි. මෙම ව්‍යාපෘති මගින් රට තුළ කාන්තා දේශ පාලන සහ ආර්ථික සවිබල ගැන්වීමේ සීමාවන්, සංක්‍රාන්ති යුක්ති ආයතන විසින් පිරිනමනු ලබන සංකේතාත්මක වන්දි සහ ප්‍රජාවන්ට අවශ්‍ය ද්‍රව්‍යමය වන්දි අතර ඇති විෂමතා, නැවත ඒකාබද්ධ වීමේ අභියෝග සහ යටත් විජිතවාදයේ දිගුකාලීන උරුමයන් ගවේෂණය කරයි. ඉඩම් ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය බොහෝ විට මන්දගාමී සහ දෝෂ සහිත බවත් කාන්තා අයිතිවාසිකම්, බලගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා ජාත්‍යන්තර අරමුදල් සහ අවධානය යොමු කිරීමේ අඩුවීමක් සිදුවෙමින් ඇති බවත් මෙම ව්‍යාපෘති සොයා ගන්න ලදී.

## නිර්දේශ

**කොලොම්බියාවේ රජය:**

- **ප්‍රතිචාරාත්මක ප්‍රතිසන්ධාන ප්‍රතිපත්ති:** සංකේතාත්මක ක්‍රියාවන්ට සමගාමීව ඉලක්කගත ද්‍රව්‍යමය වන්දි ලබා දීම කෙරෙහි අවධානය යොමු කරමින් ගැටුම්වල පුද්ගලික අත්දැකීම්වල සංකීර්ණතා හඳුනාගෙන ඒවා ඇතුළත් කරන ප්‍රතිසන්ධාන වැඩසටහන් නිර්මාණය කරන්න.

- **ග්‍රාමීය කාන්තාවන් සඳහා ආර්ථික යුක්තිය:** ආර්ථික විෂමතා ආමන්ත්‍රණය කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනය සහ ඉඩම් අයිතිවාසිකම් වැනි ග්‍රාමීය කාන්තාවන් සඳහා ආධාරක පද්ධති වැඩි දියුණු කිරීම.

- **පාරදෘශ්‍ය හා කාර්යක්ෂම ඉඩම් ප්‍රතිසාධනය:** විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය යොමු කරමින්, නීතිමය අනුකූලතාව සහ වින්දිතයන් කේන්ද්‍ර කරගත් ප්‍රතිඵල සහතික කරමින් ඉඩම් ප්‍රතිසාධන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

- **යුක්තිය පිළිබඳ ආයතන සඳහා අන්තර් ඡේදන ප්‍රවේශය:** සාමය සඳහා වූ විශේෂ අධිකරණ බලය (JEP), වින්දිතයින්ගේ ඒකකය සහ සත්‍යය, සහජීවනය සහ නැවත සිදු නොවන බව තහවුරු කිරීමේ කොමිසම (CEV) හැකි සෑම තැනකදීම, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගේ තත්වය අවබෝධ කර ගැනීම සහ සහන සැපයීම සඳහා අන්තර් ඡේදනය වන ප්‍රවේශයකට ප්‍රමුඛත්වය දිය යුතුය.

- **අසමාන යුක්තියේ යටත් විජිත මූලයන්:** සහජීවනය සහ නැවත සිදු නොවන බව තහවුරු කිරීමේ කොමිසම විසින් කරන ලද අවසාන නිර්දේශ 74 ක්‍රියාවට නැංවීම ඇගයීමේදී, අධීක්ෂණ කමිටුව විසින් යටත් විජිත උරුමයන් සහ සංහිඳියාව පිළිබඳව ඇති ව්‍යුහාත්මක බාධාවන් පිළිබඳ පසුබිම සලකා බැලිය යුතුය.

- **ප්‍රාදේශීය නායකත්වය සහ අන්තර් සංස්කෘතික අධ්‍යාපනය:** ආදිවාසී සහ අප්‍රිකානු පරම්පරාවේ ප්‍රජාවන්ගේ හඬ සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය තුළ කේන්ද්‍රගත විය යුතුය. ඔවුන්ගේ ප්‍රජාවන්ගේ නිශ්චිත අවශ්‍යතා සහ අපේක්ෂාවන් සමඟ වැඩසටහන් පෙළගැසෙන බව සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය නායකයින් සම්බන්ධ කිරීම.

- **ප්‍රතිසන්ධාන අපේක්ෂාවන්:** ප්‍රතිසන්ධානය පිළිබඳව ඒකාබද්ධ හා යථාර්ථවාදී අපේක්ෂාවක් ඇති බව සහතික කිරීම සඳහා ප්‍රතිසන්ධානය, එහි විෂය පථය සහ එහි සීමාවන් පැහැදිලි කිරීම සහ නිර්වචනය කිරීම සඳහා ජාතික සංවාදයක් පැවැත්වීම.

**සිවිල් සමාජය සහ ජාත්‍යන්තර ක්‍රියාකාරීන්:**

- **තිරසාර සහ නම්‍යශීලී අරමුදල් ආකෘති:** සාර්ථක වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ පුළුල් කිරීමට හැකි සහ වෙනස් වන සන්දර්භය සහ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වන ආකාරයෙන් සම්පත් වෙත් කිරීමට ඉඩ සපයමින් කාන්තාවන් ප්‍රමුඛ සිවිල් සමාජ සංවිධාන සඳහා දිගුකාලීන සහය ලබා දෙන අරමුදල් ආකෘති සංවර්ධනය කිරීම.

- **අර්ථවත් සහ විවිධ සහභාගීත්වය:** නිරායුධකරණය, බල ගැන්වීම සහ නැවත ඒකාබද්ධ කිරීමේ සිට ඉඩම් අයිතිවාසිකම්, ආර්ථික අවස්ථාව සහ සංක්‍රාන්ති යුක්තිය දක්වා සාමය ක්‍රියාත්මක කිරීමේ සෑම අංශයකම හිටපු සටන්කාමීන්, වින්දිතයන්, ආදිවාසී කණ්ඩායම් වැනි විවිධ කාන්තා කණ්ඩායම්වල සහභාගීත්වය සහතික කිරීම.

- **බිම් මට්ටමේ සංවිධාන වල ධාරිතා ගොඩනැගීම:** සංස්කෘතික නිපුණතාවයෙන් සහ දේශීය දැනුමෙන් ප්‍රජා කණ්ඩායම් වල විශේෂිත අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට ආත්තික කණ්ඩායම් සහ බිම් මට්ටමේ සංවිධානවල හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සම්පත් වෙත් කිරීම. සුළු හා අවිධිමත් සංවිධාන වලට අරමුදල් ලබා දිය යුතු අතර සාමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පුරාම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු විසඳීමට අරමුදල් සැපයිය යුතුය.

- **අන්තර් ඡේදනය සහ විස්තීර්ණ ස්ත්‍රී පුරුෂ භාව ක්‍රමලේඛනය:** පවතින සමාජ සහ දේශපාලන ධූරාවලිය දිගටම පවත්වාගෙන යාමට හේතු විය හැකි ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආමන්ත්‍රණය කිරීමේ තනි ප්‍රවේශයන් භාවිතයෙන් වළකින්න. ඒ වෙනුවට, විශේෂයෙන්ම ආත්තික කාන්තාවන්ට සහ කණ්ඩායම්වලට බලපාන, අතිච්ඡාදනය වන පීඩිත පද්ධති නිසා ඇතිවන ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන්න.

- **යටත්විජිතවාදය සංක්‍රාන්ති යුක්තිය මත ඇති කරන බලපෑම්:** ඓතිහාසික යටත්විජිතවාදය ආමන්ත්‍රණය කිරීමට උත්සාහ කරන පර්යේෂණ යටත්විජිත විරෝධී ක්‍රමවේද සිය පර්යේෂණ වලදී භාවිතා කළ යුතු අතර ස්වදේශික සහ අප්‍රිකානු සම්භවයක් ඇති ප්‍රජාවන් සමඟ සම්බන්ධව කටයුතු කල යුතුය.

## ඉරාක කුර්දිස්ථානය


ඡායාරූපය: ලෙවි මෙලුර් ක්ලැක්ස්

කුර්දිස්තාන්-ඉරාකය පිළිබඳ මධ්‍යස්ථානයේ පර්යේෂණ ව්‍යපෘති දේශපාලන හා නීති පද්ධතිවල අසාර්ථකත්වය, ගැඹුරින් මුල් බැසගත් පීතෘමූලිකත්වය සහ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරීන්ට වන දැඩි හිරිහැර කිරීම් ඇතුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පසුබෑම හේතුවෙන් කාන්තාවන් මුහුණ දෙන ප්‍රගතියට ඇති බාධක හෙළි කරයි. මෙම ව්‍යාපෘති මගින් අවතැන් වූ ජනගහනය කළමනාකරණය කිරීමේ කථිකාව සහ භාවිතය යන දෙඅංශයෙන්ම ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ දේශීය යථාර්ථයන් අතර නොගැලපීම පෙන්නුම් කරන අතර විදෙස්ගතව සිට නැවත පැමිණෙන සංක්‍රමණිකයන් සාමය, සංවර්ධනය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ ශ්‍රම වෙළඳපොළ සඳහා කරන දායකත්වය ඉස්මතු කරයි.

## නිර්දේශ

**ඉරාක කුර්දිස්ථාන ප්‍රාදේශීය රජය:**

- **පිරිමින් සම්බන්ධ කර ගැනීම සහ පීතෘමූලික සම්මතයන්ට අභියෝග කිරීම:** ස්ත්‍රී පුරුෂ සමාජභාවයට එරෙහි වීම් වලට සහ පුරුෂ මූලිකත්වයට අභියෝග කිරීමට සිදු කරන මුලපිරීම්, විශේෂයෙන්ම බලයේ සිටින පිරිමින් සම්බන්ධ කර ගත් මුලපිරීම් සඳහා අරමුදල් සහ සම්පත් වැඩි කිරීම.
- **ආපසු එන්නන් සඳහා ශක්‍ය සහ තිරසාර ප්‍රතිපත්ති:** ඉහළ කුසලතා ඇති කුර්දිෂ් ජාතික ස්ත්‍රීන් සහ පුරුෂයින් නැවත කුර්දිස්තානයට කැඳවා ගැනීමට සහ ආර්ථික සංවර්ධනයට සහ සාමයට දායක කර ගැනීමට තිරසාර සහ ශක්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- **ඩයස්පෝරාව සමඟ සම්බන්ධ වීම:** කුර්දි ඩයස්පෝරාවේ මානව, සංස්කෘතික, සමාජීය සහ ආර්ථික ප්‍රාග්ධනය සමඟ සම්බන්ධ වීමට සහ ඉන් ප්‍රතිලාභ ලබා ගැනීමට, කුර්දිස්ථානයේ ශ්‍රම හිඟය පිළිබඳ සාක්ෂි හඳුනා ගැනීමට සහ ආපසු පැමිණීමට ප්‍රවනතාවයක් ඇති කුර්දිෂ් සංක්‍රමණිකයින් සමඟ ජාලයන් ගොඩනැගීමට සහ තිරසාර සංවර්ධනය සඳහා ඔවුන්ගෙන් ලබා ගත හැකි දායකත්වය තක්සේරු කිරීම සඳහා ඩයස්පෝරා කටයුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම.
- **විදෙස් ගතව සිට ආපසු පැමිණි කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ දායකත්වයන් කෙරෙහි අවධානය යොමු කිරීම:** කාන්තාවන් සඳහා ධනාත්මක ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට සහ නැවත පැමිණෙන කාන්තාවන්ගේ කුසලතා වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය නොවන හවුල්කරුවන් සමඟ කටයුතු කරන්න.

**සිවිල් සමාජය සහ ජාත්‍යන්තර ක්‍රියාකාරීන්:**

- **ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම:** අවතැන් වූ කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සහ ඔවුන්ට කුසලතා අත්පත් කර ගැනීමට අවකාශය සැලසීම කෙරෙහි අවධානය යොමු කරමින්, ප්‍රාදේශීය ක්‍රියාකාරීන් සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සම්බන්ධ අවශ්‍යතා සහ අභියෝග කේන්ද්‍ර කොටගත් අවතැන් වීම පිළිබඳ ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.
- **අවතැන් වීම පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී පුහුණුව:** අවතැන් වීම් සන්දර්භයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහතික කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩසටහන් සඳහා සහාය සහ පහසුකම් සැලසීම සහ ඵලදායී ආධාරක පද්ධති නිර්මාණය කිරීමට සහාය වීම.

**ප්‍රාදේශීය ප්‍රජාවන් සහ අධ්‍යාපනඥයින්:**

- **ප්‍රජාව විසින් මෙහෙයවන විසඳුම්:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් පිළිබඳ සාකච්ඡා මෙහෙයවීමට ප්‍රාදේශීය නායකයින් සහ අධ්‍යාපනඥයින් සවිබල ගැන්වීම සහ මෙම ගැටළු ඵලදායී ලෙස විසඳීම සඳහා ප්‍රජාව විසින් මෙහෙයවන ප්‍රතිචාර ස්ථාපිත කිරීම.
- **පෙරළියක් ඇති කිරීම සඳහා මෙවලමක් ලෙස අධ්‍යාපනය භාවිතා කිරීම:** පාසල්, පල්ලි සහ අනෙකුත් ඉගෙනුම් වේදිකාවල විෂයමාලා වලට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ අධ්‍යාපනය ඒකාබද්ධ කරන්න. අනාගත සමාජ සම්මතයන් හැඩගැස්වීම සඳහා තරුණ පරම්පරාවන් සම්බන්ධ කර ගැනීම සහ ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ සහචරයින් ලෙස පිරිමින්ට ඉටු කළ හැකි ධනාත්මක කාර්යභාරය ඉස්මතු කිරීමට පිරිමින් සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න.
- **කලා පාදක ප්‍රවේශයන්:** සංවේදනය වර්ධනය කිරීම, ස්ථාපිත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන්ට අභියෝග කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ නැවත ඇගයීම ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික සැකසුම් තුළ නිර්මාණාත්මක සහ කලා පදනම් වූ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

**මාධ්‍ය, අරමුදල් සපයන්නන් සහ සාමාන්‍ය ජනතාව:**

- **බහු ක්‍රියාකාරීන් සම්බන්ධ සම්බන්ධීකරණ ප්‍රවේශයන්:** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා රජයේ, රාජ්‍ය නොවන සංවිධාන අංශයේ, අරමුදල් සපයන්නන් සහ පරිත්‍යාගශීලීන්ගේ, මාධ්‍ය සහ ප්‍රජාවේ ප්‍රතිචාර සම්බන්ධීකරණය කිරීම.

# ලෙබනනය



ඡායාරූප හිමිකම: රද්වාන් ශෙයිඛ් Unsplash

ලෙබනනයේ ව්‍යාපෘති මගින් රට මෑතකදී අත්විඳි ත්‍රිත්ව අර්බුදයන් (ආර්ථික පසුබෑම, බේරුට් වරායේ සිදුවූ පිපිරීම සහ COVID-19 වසංගතය) විශේෂයෙන්ම ලේබනගත නොවූ සිරියානු සරණාගතයින් අතර සිටින විවිධ ලිංගික දිශානතීන්, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයන්, ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය කිරීම් සහ ලිංගික ලක්ෂණ ඇති පුද්ගලයින් මුහුණ දෙන කොන් කිරීම, හිරිහැර කිරීම සහ වෙනස් කොට සැලකීම තීව්‍ර කර ඇති බව සොයා ගන්නා ලදී. තවද මෙම ව්‍යාපෘති මෙම ප්‍රජාවන් සඳහා මනෝ සමාජීය සහයෝගයේ හිඟකම සටහන් කළේය. එමෙන්ම මෙම ව්‍යාපෘති ත්‍රිත්ව අර්බුදය සංක්‍රමණික කාන්තාවන්ට අසමානුපාතික ලෙස බලපාන බවත්, ඔවුන්ගේ දුර්වලතා උග්‍ර කරමින් විරැකියාව, හුදකලා වීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් සහ මිනිස් ජාවාරම් වලට ගොදුරු වීමේ අවදානම වැඩි කළ බවත් පෙන්වා දෙන ලදී.

# නිර්දේශ

### ලෙබනන් රජය:

- **වෙනස් කොට සැලකීමේ නීති අහෝසි කිරීම සහ නීතිමය ආරක්ෂාව ශක්තිමත් කිරීම:** දණ්ඩ නීති සංග්‍රහයේ 534 වගන්තිය සමලිංගික ක්‍රියාවන් අපරාධයන් ලෙස සලකයි. මෙය සහ ලිංගික ශ්‍රමිකයින් අපරාධකරුවන් ලෙස සළකන වෙනත් නීති අහෝසි කළ යුතුය.

- **සංක්‍රමණික කාන්තාවන් සඳහා නීතිමය ආරක්ෂාව තර කිරීම:** ලෙබනන් රජය, රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේදීම සංක්‍රමණික කාන්තාවන්ගේ ආරක්ෂාව සහ යුක්තිය සළසන නීති සම්පාදනය කර බලාත්මක කළ යුතුය.

### ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ලෙබනනයේ රාජ්‍ය නොවන සංවිධාන:

- අන්තර් ඡේදන ප්‍රවේශයක් අනුගමනය කරන්න: ලෙබනනයේ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ රාජ්‍ය නොවන සංවිධාන විවිධ ලිංගික දිශානතීන්, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයන්, ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය කිරීම් සහ ලිංගික ලක්ෂණ ඇති අයගේ සංකීර්ණතා අවබෝධ කර ගැනීම සඳහා අන්තර් ඡේදන දෘශ්‍යකාවයක් භාවිතා කළ යුතුය.

- අන්තර් ජාතික ක්‍රියාකාරීත්වයට සහාය වීම: විවිධ ලිංගික දිශානතීන්, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයන්, ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය කිරීම් සහ ලිංගික ලක්ෂණ ඇති අය සඳහා පෙනී සිටින ලෙබනනයේ සහ කලාපීය සංවිධාන අතර සහයෝගීතාව දිරිමත් කිරීම සහ අන්තර් ජාතික ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීම මගින් ලෙබනනයේ සහ ඉන් ඔබ්බෙහි ඔවුන්ගේ ක්‍රියාකාරී ව්‍යාපාරයේ ඔරොත්තු දීමේ හැකියාව සහ සඵලතාවය ශක්තිමත් කිරීම.

- තිරසාර අරමුදල් වැඩි කිරීම: ලෙබනනයේ විවිධ ලිංගික දිශානතීන්, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයන්, ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රකාශනය කිරීම් සහ ලිංගික ලක්ෂණ ඇති අය කේන්ද්‍ර කරගත් සේවාවන් සඳහා, විශේෂයෙන් ඔවුන්ගේ මානසික සෞඛ්‍ය සහ මනෝ සමාජීය සහාය සඳහා තිරසාර ලෙස අරමුදල් වැඩි කිරීම වඩා අවශ්‍ය වේ.

### රජය, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන:

- **කෆාලා ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන්න:** ලෙබනන් රජය, ජාත්‍යන්තර ආයතනවල සහාය ඇතිව, ගෘහ සේවිකාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කෆාලා ක්‍රමය කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතුය.

- **සංක්‍රමණික අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු කරන්න:** සංක්‍රමණික කාන්තාවන් සඳහා වඩාත් ඇතුළත්, ආරක්ෂිත සහ සහායක පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ලෙබනන් රජය, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධ වූ සහයෝගී ප්‍රවේශයක් ක්‍රියාත්මක කළ යුතුය.

- **සංක්‍රමණිකයන් කේන්ද්‍රීය වැඩසටහන් සඳහා සහාය වීම:** ලෙබනන් රජය සංක්‍රමණික ප්‍රජාවන්ට රැකියා පුහුණුව, නීති ආධාර සහ සමාජ සහයෝගය ලබා දෙන වැඩසටහන් සඳහා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය.

### සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ රටවල් වල ආන්ඩු:

- **ද්විපාර්ශ්වික සංක්‍රමණ ගිවිසුම්:** සංක්‍රමණික ගෘහ සේවිකාවන්ගේ මව් රටවල් වල ආන්ඩු ඔවුන්ගේ සංක්‍රමණික පුරවැසියන් සඳහා වඩාත් සාධාරණ කොන්දේසි සැපයීම සඳහා ලෙබනන් රජය සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම් වලට පිවිසීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

## සියරාලියෝන්



ජාත්‍යන්තර හිමිකම: ඉඩම් ප්‍රතිපත්ති, ස්ත්‍රී පුරුෂ භාවය සහ ඔනු ෆීෆී පද්ධති ව්‍යාපෘතිය

සියෙරා ලියොන්හි ඉඩම් යුක්තිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පෙන්නුම් කරන්නේ දරිද්‍රතාවය ඉඩම් සඳහා ප්‍රවේශය සීමා කරන ප්‍රධාන සාධකය වන බවයි. මීට අමතරව සංක්‍රමණිකයෙකු වීම හෝ ප්‍රදේශවාසීයෙකු නොවීමත් ඉඩම් සඳහා ප්‍රවේශය සීමා කරයි. මෙය සංස්කෘතික පීතෘමූලික සම්මතයන්ට මුහුණ දෙන කාන්තාවන්ට අසමානුපාතික ලෙස බලපානු ලබන අතර ඔවුන්ගේ ඉඩම් අයිතිය සීමා කරයි. තවද, ආයතනික ක්‍රියාකාරීන් සියෙරා ලියෝනියානු ආර්ථිකය ලිබරල්කරණයෙන් අයුතු ප්‍රයෝජන ගනිමින් කාන්තාවන්ට ඉඩම් සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීමට සහ කාන්තාවන් නෙරපා හැරීමට කටයුතු කරති. සමාජ සාධාරණත්වය සහ කාන්තා සවිබල ගැන්වීම්වලට වඩා ආර්ථික සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙනු ලැබීම, දිගු කාලීන ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සියල්ල ඇතුළත් සාමය ස්ථාපිත කිරීමට දරන උත්සාහයන් වළක්වයි.

## නිර්දේශ

**සියරාලියෝන් රජය:**

- **ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ ක්‍රියාත්මක කිරීම:** කාන්තාවන්ට ඉඩම් සඳහා සමාන අයිතිය සහ ප්‍රවේශය සහතික කෙරෙන නීතිමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ශක්තිමත් කර සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ යුතුය.
- **ඉඩම් ප්‍රතිපත්ති සහ ඇතුළත් කිරීම්:** ජාතික ඉඩම් කොමිෂන් සභා පනත (2022) සහ චාරිත්‍රානුකූල ඉඩම් හිමිකම් පනත (2022) හි දක්වා ඇති ප්‍රගතිශීලී විධිවිධාන ඇතුළත් කිරීම සඳහා පවතින ඉඩම් ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කරන්න. මෙයට සමගාමීව සම්පූර්ණ සියල්ල ඇතුලත් ඉඩම් නීතියක් සකස් කළ යුතුය.
- **කාන්තා අයිතිවාසිකම් සහ ආයතනික අවශ්‍යතා:** ආයතනික ඉඩම් අවශ්‍යතා කාන්තා අයිතිවාසිකම් සමඟ ගැටෙන විට කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න. සංවර්ධනයේ නාමයෙන් ඉඩම් අයිතිය ඇතුළු කාන්තා අයිතීන් උල්ලංඝනය කිරීමට ඉඩ සලසන නීතිමය හිඩැස් වැසීම මෙයට ඇතුළත් වේ.
- **සිවිල් සමාජය සහ ප්‍රාදේශීය සංවිධාන:** අරමුදල් සහ ක්‍රියාකාරී සහයෝගීතාවය සැපයීම වැනි සහය හරහා බිම් මට්ටමේ සිවිල් සමාජ ආයතන සහ ප්‍රාදේශීය සංවිධානවලට සහාය වීම.

**සාම්ප්‍රදායික අධිකාරීන්:**

- **චාරිත්‍රානුකූල නීතිය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය:** ඉඩම් සහ ඉඩම් සම්පත් කළමනාකරණය කිරීම සඳහා පිහිටුවා ඇති කමිටු ඇතුළුව ප්‍රධාන තීරණ ගැනීමේ ආයතනික ව්‍යුහයන්ගේදී කාන්තාවන්ගේ සමාන නියෝජනය සහ සහභාගීත්වය කෙරෙහි අවධානය යොමු කරමින් ආයතනය ප්‍රතිසංස්කරණය කළ යුතුය.

**සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන:**

- **ඉඩම් යුක්තිය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්:** ඉඩම් ගනුදෙනුවලදී කාන්තාවන් සාධාරණ ලෙස නියෝජනය කිරීමටත්, ඔවුන්ගේ අයිතීන් උල්ලංඝනය වන විට යුක්තිය ඉටු කර ගැනීමටත් හැකි වන පරිදි, කාන්තාවන්ට නීතිමය සහ ආරවුල් විසඳීමේ සහාය වැඩිදියුණු කළ යුතුය. නව නීති සහ ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යාපනය සහ තොරතුරු හුවමාරු කර ගැනීමට ද ප්‍රමුඛත්වය දිය යුතුය.

# ශ්‍රී ලංකාව



ඡායාරූප හිමිකම: ෆ්‍රෙඩ්රික් ඔෆ්ලන්ඩර්

ශ්‍රී ලංකාව පිළිබඳ පර්යේෂණ අවධානය යොමු කරන්නේ යුක්තිය, ඉඩම් සහ සංක්‍රමණය යන කරුණු කෙරෙහි ය. අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයෙන් දිවි ගලවා ගත් අය සඳහා වන යුක්තිය ඉටු කිරීමේ සැලකිය යුතු අඩුපාඩු මෙන්ම කාන්තාවන්ට යුක්තිය සඳහා ප්‍රවේශ වීමේ සාමාන්‍ය පද්ධතිමය හිඟයක් ඇති බව ව්‍යාපෘති සොයාගැනීම් පෙන්වා දෙයි. ඉඩම් සම්බන්ධයෙන් කේන්ද්‍රයේ පර්යේෂණ පෙන්නුම් කරන්නේ ඉඩම් අයිතිය සඳහා ඒකාකාර නීතියක් නොමැතිකම, චාරිත්‍රානුකූල නීතිවල සංකීර්ණතා, ජනවාර්ගික හා සංස්කෘතික සම්මතයන් සහ යුද්ධයේ බලපෑම කාන්තාවන්ගේ ඉඩම් හිමිකමට බලපාන බවයි. තවද කේන්ද්‍රයේ ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ට ආර්ථික සහ ජීවනෝපාය අවස්ථා සඳහා සීමිත ප්‍රවේශයක් ඇති බව සොයා ගත් අතර ඔවුන්ට මූලික සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමට නොහැකි බවත් විදෙස්ගතව සිට ආපසු පැමිණෙන සංක්‍රමණික කාන්තාවන් සැලකිය යුතු වෙනස්කම් කිරීම් සහ අභියෝගවලට මුහුණ දෙන බවත් සොයා ගන්නා ලදී.

# නිර්දේශ

**ශ්‍රී ලංකා රජය:**

- **අතුරුදහන් වූවන් සඳහා යුක්තිය:** අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය කෙරෙහි විශ්වාසය නැවත ඇති කිරීම සඳහා අතුරුදහන්වීම් සිද්ධීන්ට ප්‍රමුඛත්වය දීම සහ මෙම සිදුවීම්වල සිදු වූ දේ විමර්ශනය කිරීම.

- **අභ්‍යන්තරව අවතැන් වූවන් සඳහා නිවාස ලබා දීම:** උද්ධමනයට අනුකූලව අවතැන් වූ පුද්ගලයින් සඳහා දැනට ලබා දෙන ඉඩම් සහ නිවාස ප්‍රදානයන් වැඩි කිරීම. නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති වලට අවශ්‍ය දත්ත ලබා ගැනීමට අවතැන් වූවන්ගේ අත්දැකීම් ලේඛනගත කිරීමේ කටයුතු පුළුල් කිරීම.

- **ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් සඳහා යුක්තිය:** ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ නීතිමය නිර්වචනයක් මූලික නීති රාමු වලට ඇතුළත් කරන්න. සාක්ෂිකරුවන්ගේ සාක්ෂියට ඇති කම්පනයේ බලපෑම පිළිගනිමින්, ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ නඩු වලදී සාක්ෂි සඳහා සහාය දැක්වීමේ අවශ්‍යතාවය සහ කැමැත්ත පිළිබඳ නීතිමය ප්‍රමිතීන් සමාලෝචනය කරන්න. උසාවියේදී වින්දිතයින්ගේ සහභාගීත්ව අයිතිවාසිකම් සහතික කරන්න.

- **ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් ගැලවීමට ලක්වූ වින්දිතයාට ලබා දෙන සහය:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව සහ ගැලවීමට ලක්වූ වින්දිතයාගේ ගෞරවය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ නඩු වලදී පොලිස් නිලධාරීන් සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන් සඳහා අනිවාර්යයෙන්ම ආයතනික පුහුණුවක් ලබා දීම.

- **කාන්තාවන්ට ඉඩම් සඳහා වැඩි ප්‍රවේශයක් සහ පූර්ණ පාලනයක් ලබා ගැනීමට ඉඩ සැලසීම සඳහා පවතින නීති තවදුරටත් සංශෝධනය කර නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතුය:** මෑත කාලීන නීති සංශෝධන (එනම් ඉඩම් සංවර්ධන ආඥාපනත) නිසි ලෙස ක්‍රියාත්මක කරන බවටත්, ඉඩම් භාවිතය සම්බන්ධයෙන් කාන්තාවන්ට වැඩි අධිකාරියක් සහ තීරණ ගැනීමේ බලයක් ලබා දෙන බවටත් රජයේ පරිපාලකයින් සහතික විය යුතුය.

- **විදෙස්ගතව සිට නැවත පැමිණෙන සංක්‍රමණිකයින් දිරිමත් කිරීම:** ඉහළ දක්ෂතා ඇති විදෙස්ගතව සිට නැවත පැමිණෙන සංක්‍රමණිකයින්ට ආර්ථික සංවර්ධනයට සහ සාමයට දායක වීමට ඇති හැකියාව හඳුනා ගනිමින් ඔවුන් ආකර්ෂණය කර ගැනීමට සහ ඒකාබද්ධ කිරීමට ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- **අනාගත සාමය සහ ආර්ථික ස්ථාවරත්වය සඳහා ඒකාබද්ධ සංවාදයක් පැවත් වීම:** අනන්‍යතාවය සහ සංස්කෘතිය පිළිබඳ සාකච්ඡා සාමය සහ ආර්ථික සංවාදවලට ඇතුළත් කරන්න. කලාව මත පදනම් වූ භාවිතයන් සහ පර්යේෂණ, ප්‍රතිපත්ති සම්පාදනයට මඟ පෙන්විය හැකි අවබෝධයක් ලබා දෙයි.

**ජාත්‍යන්තර ප්‍රජාව:**

- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් ප්‍රතිපත්ති:** ජාත්‍යන්තර මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සන්නිවේදනය සඳහා සහාය වීම.

- **ආත්තික කාන්තාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පිළිබඳ ප්‍රතිපත්ති වල කේන්ද්‍රස්ථානය ලබා දෙන්න:** බල පද්ධතිවලට කාන්තාවන් වඩා හොඳින් ඒකාබද්ධ කිරීමට අදහස් කරන පවතින ප්‍රතිපත්ති වල අවධානය ආන්තික ප්‍රජාවන් වෙත යොමු කළ යුතු අතර එමඟින් මෙම ප්‍රජාවන්ට හානියට හා ප්‍රචණ්ඩත්වයට ලක් කරන පද්ධතිමය ගැටලුවලට විසඳුම් ලබා දිය යුතුය.

- **අතුරුදන් වූවන්ගේ කාර්යාලයේ වගවීම:** අතුරුදන් වූවන්ගේ පවුල්වල ප්‍රයත්නයන්ට ජාත්‍යන්තර ක්‍රියාකාරීන් සහාය ලබා දිය යුතු අතර අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය හරහා අතුරුදන් කරවූවන් පිළිබඳ සිද්ධීන් විමර්ශනය කිරීමට ශ්‍රී ලංකා රජයට බලපෑම් කිරීම අත්‍යවශ්‍ය වේ.

- **ශ්‍රී ලාංකේය ඩයස්පෝරාවේ ජාත්‍යන්තර මැදිහත්වීම:** ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සියලු දෙනා ඇතුළත් සාමය කෙරෙහි අවධානය යොමු කරමින් ඩයස්පෝරාව තුළ සිටින විශේෂඥයින් සම්බන්ධ කර ගැනීම සහ බලමුලු ගැන්වීම.

- සහභාගීත්ව සහ කලාව පදනම් වූ ක්‍රම සඳහා සහාය ලබා දීම: දත්ත රැස් කිරීම, ඉගෙනීම සහ බෙදා හැරීම සඳහා කලාව පදනම් වූ ක්‍රමවේද ලබා දෙන අද්විතීය දායකත්වය පිළිගැනීම සහ ඒ සඳහා මූල්‍යමය වශයෙන් සහාය වීම.

## උගන්ඩාව



ඡායාරූප හිමිකම: ඉවොටෙ රුබොම්බොරා

උගන්ඩාවේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති, ගැටුමෙන් පසු එරට අත්දැකීම් පිළිබඳ පුළුල් පරාසයක සොයාගැනීම් සපයයි. කාන්තා සටන්කාමීන්, ‘පාවෙන ජනගහනය’, සොල්දාදුවන්ගේ ‘තාවකාලික පවුල්’ සහ විදෙස්ගතව සිට නැවත පැමිණි කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන් දැඩි ලෙස කොන් කිරීම් වලට, අපකීර්තියට, ආර්ථික අරගලවලට සහ සමාජ අභියෝගවලට මුහුණ දෙති. පීතෘමූලික ඉඩම් හිමිකම් ක්‍රමය සියලුම කාන්තාවන්ට, විශේෂයෙන්ම කාන්තා හිටපු සටන්කාමීන්ට සහ ඔවුන්ගේ දරුවන්ට සැලකිය යුතු අභියෝග ඇති කරන අතර, ඉඩම් හිමිකම් පිළිබඳ ආරවුල් සහ අනාරක්ෂිත භාවයක් ඇති කරයි. කාන්තා හිටපු සටන්කාමීන් සමාජයට සාර්ථක ලෙස නැවත එක්වීමට බලපෑම් ඇතිකරමින් ඔවුන්ව දිගු කාලීන සෞඛ්‍ය සහය ලබා දීමේදී සහ පුනරුත්ථාපන වැඩසටහන් වලදී නොසලකා හැරීමට ලක් කිරීමක් සිදු වේ. දික් ඇදුනු ගැටුම් සහ අවතැන්වීම් සමීප සබඳතා, ඥාතිත්ව පද්ධති සහ සම්ප්‍රදායික භාවිතයන් සැලකිය යුතු ලෙස කඩාකප්පල් කර ඇති අතර, බලපෑමට ලක් වූ ජනගහනය අන්තර් පරම්පරාගත ගැටුම් සහ දැඩි මානසික සෞඛ්‍ය ගැටලු වලට මුහුණ දී සිටිති.

## නිර්දේශ

**රජය සහ ප්‍රතිපත්ති සම්පාදකයින්:**

- **රජයේ මැදිහත්වීම සහ සහාය:** අපකීර්තිය, ප්‍රචණ්ඩත්වය සහ සමාජ ඒකාබද්ධතාවය පිළිබඳ ගැටළු විසඳීම සඳහා විදෙස් ගතව සිට නැවත පැමිණි කාන්තාවන් සහ ගැටුම්වලින් උපන් දරුවන් ඇතුළු ආත්තික ප්‍රජාවන්ට සහ පාවෙන ජනගහනයට අඛණ්ඩව සම්බන්ධ වී ශක්තිමත් සහයෝගයක් ලබා දෙන්න.
- **නීතිමය ක්‍රියාවලීන් සරල කිරීම:** මාපිය හෝ උපන් ස්ථාන පිළිබඳ තොරතුරු නොමැති පුද්ගලයින් සඳහා නීතිමය ලියකියවිලි ලබා දීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම, විශේෂයෙන්ම සිරභාරයේදී උපන් දරුවන් සඳහා රජයේ සේවාවන් සහ නීතිමය අයිතිවාසිකම් සඳහා වඩා හොඳ ප්‍රවේශයක් ලබා දීම.
- **ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ප්‍රජා භාරය:** ඉඩම් ගැටුම් සහ ඉඩම් වාණිජකරණය නිසා පැන නැගී ඇති අභියෝගවලට විසඳුම් ලෙස ප්‍රජා විශ්වාසය ශක්තිමත් කිරීම, සාම්ප්‍රදායික ඉඩම් සහ ඥාතිත්ව පද්ධති ගැලපීමට පහසුකම් සැලසීම සහ ගැටුම්වලින් පීඩාවට පත් වූ සැමට, විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමයින්ට සාධාරණ ඉඩම් ප්‍රවේශයක් සහතික කිරීම.
- **හමුදා මූලෝපාය සහ සේවා පැවරුම් ප්‍රතිපත්ති:** සාමකාමී ගැටුම් නිරාකරණය අවධාරණය කිරීම, තාවකාලික පවුල් ගොඩනැගීම වැළැක්වීම සහ සොල්දාදුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා සේවා පැවරුම් කාලසීමාව සහ වාර ගණන සීමා කිරීම සඳහා හමුදා උපාය මාර්ග නැවත අර්ථ දක්වන්න.

**ජාත්‍යන්තර සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන:**

- **ජාත්‍යන්තර ක්‍රියාකාරීන්ගේ භූමිකාව:** සන්නද්ධ කණ්ඩායම් සමඟ කලින් සම්බන්ධ වූ පුද්ගලයින්ට අපකීර්තියට ලක් කිරීම සහ වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීම සඳහා පුළුල් පරාසයක ක්‍රියාකාරීන් සමඟ ක්‍රියාකාරීව වැඩ කරන්න. මෙහිදී බලපෑමට ලක් වූ ජනගහනයේ විශේෂිත අවශ්‍යතා සහ සන්දර්භයන් කෙරෙහි අවධානය යොමු කරන්න.

**ප්‍රජාවන් සහ සංස්කෘතික ආයතන:**

- **පශ්චාත් යුධ සමාජ අනන්‍යතාවයට ප්‍රමුඛත්වය දෙන්න:** සමාජ සම්බන්ධතාවට සහාය වීම, අන්තර් පරම්පරා සංවාදය දිරිගැන්වීම සහ ප්‍රජාවන් තුළ සාමූහික අනන්‍යතාවය පෝෂණය කිරීම සඳහා වැඩසටහන් සංවර්ධනය කරන්න.

**මාධ්‍ය සහ සන්නිවේදන අංශ:**

- **ඵලදායී ප්‍රජා ප්‍රවේශය:** ප්‍රජා ප්‍රවේශය සහ මහජන විවාදය සඳහා විශේෂයෙන් ග්‍රාමීය, යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල, බෙදීම් මඟහරවා ගැනීමට සහ විවිධ ජන විකාශයන්ට අයත් ආත්තික හඬවලට ඉඩක් ලබා දීමට මෙවලම් ලෙස ගුවන්විදුලිය සහ අනෙකුත් මාධ්‍ය භාවිතා කරන්න.

**සෞඛ්‍ය හා සමාජ සේවා:**

- **දිගුකාලීන සෞඛ්‍ය සහ පුනරුත්ථාපන වැඩසටහන්:** හිටපු සටන්කාමීන් මත සිදු වන ගැටුමේ දිගුකාලීන කායික, මානසික සහ සමාජීය බලපෑම් ආමන්ත්‍රණය කරන සම්පූර්ණ සියල්ල ඇතුලත් නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

සම්පූර්ණ වාර්තාව කියවීම සඳහා
www.TheGenderHub.com
වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.





GENDER JUSTICE & SECURITY
A GCRF HUB

UK Research and Innovation